## වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව

# කාර්ය සාධන වාර්තාව - 2012

## පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය

# <u>මෙහෙවර ප්‍රකාශය</u>

***“ශ්‍රී ලාංකික ප්‍රජාවගේ අභිවෘද්ධිය***

***තහවුරු කරනු වස් වන සම්පත් සංරක්ෂණය සහ***

***සංවර්ධනය කිරීම ”***

# පටුන

පිටුව


- මෙහෙවර ප්‍රකාශය I
- පටුන II
- වගු ලැයිස්තුව III
- ඇමුණුම් ලැයිස්තුව V
- හැඳින්වීම VI

01 සමාජ වන විද්‍යා සහ වන ව්‍යාප්ති අංශය 01

02 වන සංගණන හා කළමනාකරණ අංශය 07

03 පරිසර කළමනාකරණ අංශය 32

04 පර්යේෂණ සහ අධ්‍යාපන අංශය 41

05 වන ආරක්ෂණ සහ නීති ක්‍රියාත්මක කිරීමේ අංශය 51

06 සැලසුම් සහ ප්‍රගති පාලන අංශය 57

07 පිරිස් හා පාලන අංශය 62

08 මුදල් අංශය 65

# වගු ලැයිස්තුව


| | | | පිටුව |
|---|---|---|---|
| 1. | වගුව 1.1 | දැනුවත් කිරීමේ සහ ප්‍රචාරණ වැඩ සටහන් | 02 |
| 2. | වගුව 1.2 | රුක් රෝපණ ක්‍රියාකාරකම් | 03 |
| 3. | වගුව 1.3 | 2010 සිට 2012 දක්වා ප්‍රජා වන කළමනාකරණ ව්‍යාපෘතිය ක්‍රියාත්මක වූ ස්ථාන | 04 |
| 4. | වගුව 2.1 | නැවත වන වගා කිරීමේ වැඩසටහන - 2012 | 11 |
| 5. | වගුව 2.2 | බීජ පැල නිෂ්පාදනය - 2012 | 12 |
| 6. | වගුව 2.3 | නොමේරූ වන වගා නඩත්තු කිරීම - 2012 | 14 |
| 7. | වගුව 2.4 | පූර්ව වාණිජමය තුනී කිරීම් – 2012 | 16 |
| 8. | වගුව 2.5 | වාණිජමය තුනී කිරීම් - 2012 | 17 |
| 9. | වගුව 2.6 | පශ්චාත් හෙළීම් සංගණන – 2012 | 18 |
| 10. | වගුව 2.7 | රිකිලි නඩත්තු කිරීම – 2012 | 18 |
| 11. | වගුව 2.8 | රිකිලි කළමනාකරණය – 2012 | 19 |
| 12. | වගුව 2.9 | ශුද්ධ කිරීම - 2012 | 19 |
| 13. | වගුව 2.10 | ආරෝහක කැපීම - 2012 | 20 |
| 14. | වගුව 2.11 | මැහෝගනී වන වගා කළමනාකරණය කිරීම - 2012 | 20 |
| 15. | වගුව 2.12 | GPS සහ ප්‍රිස්මේන්තු කොම්පාසු උපයෝගි කර ගනිමින් සිදු කරන ලද වන වගා වල මිණුම් | 21 |
| 16. | වගුව 2.13 | ස්වාරක්ෂක කලාපීය වන වගා ස්ථාපනය කිරීම සහ පරිහානියට පත් වන වගා පුනරුත්තාපනය කිරීම | 22 |
| 17. | වගුව 2.14 | සුපෝෂණ වන වගා නඩත්තු කිරීම - 2012 | 22 |
| 18. | වගුව 2.15 | මිණුම් කිරීම සහ මායිම් සලකුණු කිරීම | 22 |
| 19. | වගුව 2.16 | මධ්‍යම කඳුකරයේ කඳු මුදුන් සංරක්ෂණය කිරීම | 23 |
| 20. | වගුව 2.17 | මධ්‍යම කඳුකරයේ කඳු මුදුන්හි 2011 වසරේදී ස්ථාපනය කරන ලද වන වගා නඩත්තු කිරීම | 24 |
| 21. | වගුව 2.18 | මධ්‍යම කඳුකරයේ කඳු මුදුන්හි 2010 වසරේදී ස්ථාපනය කරන ලද වන වගා නඩත්තු කිරීම | 24 |
| 22. | වගුව 2.19 | වන වගාවල මාර්ග නඩත්තු කිරීම - 2012 | 24 |
| 23. | වගුව 2.20 | බදු දුන් ඉඩම් ප්‍රමාණය සහ බදු ආදායම - 2012 | 25 |
| 24. | වගුව 2.21 | 2012 වසරේ පුද්ගලික අංශයේ නැවත වන වගා කිරීමේ වැඩසටහනේ තත්වය | 26 |

| | | | |
|---|---|---|---|
| 25. | වගුව 2.22 | සංචාරක බංගලා වලින් ලද ආදායම - 2012 | 27 |
| 26. | වගුව 2.23 | වන සංගණන හා කළමනාකරණ අංශයේ මූල්‍යමය ප්‍රගතිය - 2012 | 29 |
| 27. | වගුව 2.24 | වන සම්පත් වලින් ලද ආදායම – 2012 | 30 |
| 28. | වගුව 3.1(අ) | උඩවත්ත කැලය නැරඹීමට පැමිණි සංචාරකයින් සංඛ්‍යාව සහ ලද අදායම | 35 |
| 29. | වගුව 3.1(ආ) | නකල්ස් (ඩීන්ස්ටන්) වෙත පැමිණි සංචාරකයින් සංඛ්‍යාව සහ ලද අදායම | 36 |
| 30. | වගුව 3.1(ඇ) | නකල්ස් (පිටවලපතන) වෙත පැමිණි සංචාරකයින් සංඛ්‍යාව සහ ලද අදායම | 36 |
| 31. | වගුව 3.1(ඈ) | සිංහරාජය (පිටදෙනිය) වෙත පැමිණි සංචාරකයින් සංඛ්‍යාව සහ ලද ආදායම | 36 |
| 32. | වගුව 3.1(ඉ) | සිංහරාජය (කුඩව, රත්නපුර) වෙත පැමිණි සංචාරකයින් සංඛ්‍යාව සහ ලද ආදායම | 37 |
| 33. | වගුව 3.1(ඊ) | හුරුළු පාරිසරික උද්‍යානය වෙත පැමිණි සංචාරකයින් සංඛ්‍යාව සහ ලද ආදායම | 37 |
| 34. | වගුව 3.1(උ) | කොට්ටව වනාන්තරය වෙත පැමිණි සංචාරකයින් සංඛ්‍යාව සහ ලද ආදායම | 37 |
| 35. | වගුව 3.1(ඌ) | කන්නෙලිය වනාන්තරය වෙත පැමිණි සංචාරකයින් සංඛ්‍යාව සහ ලද ආදායම | 38 |
| 36. | වගුව 3.2 | අනුමත කල ව්‍යාපෘති ලැයිස්තුව | 38 |
| 37. | වගුව 3.3 | නකල්ස් සංරක්ෂණ වනාන්තරය සඳහා ඉඩම් අත්පත් කර ගැනීම | 40 |
| 38. | වගුව 5.1 | හදිසි වැටලීම් අංශයේ ප්‍රගතිය | 53 |
| 39. | වගුව 5.2 | වන සංරක්ෂණ දෙපාර්තමේන්තු අරමුදලේ මූල්‍යමය ප්‍රගතිය | 55 |
| 40. | වගුව 6.1 | ඒකාබද්ධ අරමුදල උපයෝගි කර ගනිමින් ඉදිකල ගොඩනැගිලි පිළිබද තොරතුරු - 2012 | 58 |
| 41. | වගුව 6.2 | 2012 වසර තුල ගොඩනැගිලි ඉදිකිරීම හා සම්බන්ධ මූල්‍යමය කාර්ය සාධනය | 59 |
| 42. | වගුව 6.3 | වර්ෂ 2012 තුල නඩත්තු කරන ලද ගොඩනැගිලිවල තොරතුරු | 59 |
| 43. | වගුව 6.4 | ගොඩනැගිලි නඩත්තුව - මූල්‍යමය ප්‍රගතිය | 61 |
| 44. | වගුව 8.1 | දෙපාර්තමේන්තු අය වැය ප්‍රගතිය | 66 |
| 45. | වගුව 8.2 | රාජ්‍ය සේවකයින්ගේ අත්තිකාරම් ගිණුම් පිළිබඳ තොරතුරු 283011 සහ 283012 | 67 |
| 46. | වගුව 8.3 | 2012 වසර තුල රැස් කල ආදායම | 67 |
| 47. | වගුව 8.4 | වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අරමුදල් ගිණුම හා සම්බන්ධ ගනුදෙනුවල සාරාංශය | 68 |

## ඇමුණුම් ලැයිස්තුව


| | | | පිටුව |
|---|---|---|---|
| 1. | ඇමුණුම : I | සමාජ වන විද්‍යා වැඩ සටහන් සඳහා බීජ පැල නිෂ්පාදනය - 2012 | 69 |
| 2. | ඇමුණුම: II | නව ගොවි වන වගා ස්ථාපනය කිරීම - 2012 | 70 |
| 3. | ඇමුණුම: III | පැරණි ගොවි වන වගා කළමනාකරණය - 2012 | 71 |
| 4. | ඇමුණුම: IV | ගෙවතු සංවර්ධනය සහ රුක් කළමනාකරණය | 72 |
| 5. | ඇමුණුම : V | සුළු පරිමාණ පුද්ගලික ඉඩම් හිමියන් සඳහා පුද්ගලික වනවගා වැඩ සටහන | 73 |
| 6. | ඇමුණුම: VI | වන අපරාධ වල සාරාංශය (උසාවි නඩු) - 2012 | 74 |
| 7. | ඇමුණුම: VII | වන ආඥා පනතේ 30 වන වගන්තිය යටතේ සිදු කල වන අපරාධ - 2012 | 76 |
| 8. | ඇමුණුම : VIII | 2012 වසර තුලදී රාජසන්තක කල වාහන | 77 |
| 9. | ඇමුණුම : IX | හදිසි වැටලීම් ඒකක වල කාර්ය සාධනය - 2012 | 80 |
| 10. | ඇමුණුම : X | ක්‍රියාකාරීත්වයේ පවතින ලියාපදිංචි මුළු දැව ව්‍යාපාර සංඛ්‍යාව - 2012 | 81 |
| 11. | ඇමුණුම : XI | 2012 වසර තුල ලියා පදිංචි වූ දැව පදනම් කරගත් නව ව්‍යාපාර | 82 |
| 12. | ඇමුණුම : XII | පුහුණු වැඩ සටහන් - 2012 | 83 |
| 13. | ඇමුණුම: XIII | ත්‍යාග ගෙවීම් - 2012 | 84 |
| 14. | ඇමුණුම :XIV | දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම් – 2012 | 85 |
| 15. | ඇමුණුම : XV | ඉඩම් නිදහස් කිරීම - 2012 | 86 |
| 16. | ඇමුණුම :XVI | මූල්‍යමය ප්‍රගතිය - 2012 | 87 |
| 17. | ඇමුණුම : XVII | පැල හා බීජ අපනයනය සඳහා බලපත්‍ර නිකුත් කිරීමෙන් ලද ආදායම - 2012 එක්දින සේවාව | 88 |
| 18. | ඇමුණුම : XVIII | පැල හා බීජ අපනයනය සඳහා බලපත්‍ර නිකුත් කිරීමෙන් ලද ආදායම - 2012 සාමාන්‍ය සේවාව | 89 |
| 19. | ඇමුණුම : XIX | ඉරූ දැව, ගෘහ භාණ්ඩ, අත්කම්, සෙල්ලම් බඩු සහ අගය එකතු කල දැව අපනයනය සඳහා බලපත්‍ර නිකුත් කිරීමෙන් ලද ආදායම - 2012 - එක්දින සේවාව | 90 |
| 20. | ඇමුණුම : XX | ඉරූ දැව, ගෘහ භාණ්ඩ, අත්කම්, සෙල්ලම් බඩු සහ අගය එකතු කල දැව අපනයනය සඳහා බලපත්‍ර නිකුත් කිරීමෙන් ලද ආදායම - 2012 - සාමාන්‍ය සේවාව | 91 |
| 21. | ඇමුණුම : XXI | ගෘහ භාණ්ඩ ප්‍රවාහනය සඳහා බලපත්‍ර නිකුත් කිරීම – 2012 - රත්මලාන | 92 |
| 22. | ඇමුණුම: XXII | ගෘහ භාණ්ඩ ප්‍රවාහනය සඳහා බලපත්‍ර නිකුත් කිරීම – 2012 - ප්‍රධාන කාර්යාලය | 93 |
| 23. | ඇමුණුම : XXIII | විවිධ වර්ගයේ වාර්ෂික බලපත්‍ර නිකුත් කිරීමෙන් ලද ආදායම - 2012 | 84 |

# හැඳින්වීම

ජාතියේ සෞභාග්‍ය සහතික කිරීම සඳහා ශ්‍රී ලංකාවේ වන සම්පත සංරක්ෂණය කොට සංවර්ධනය කිරීම, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ මෙහෙවර වේ. මෙම මෙහෙවර සහතික කිරීම උදෙසා මෙම වාර්තාවේ දක්වා ඇති ක්‍රියාකාරකම් 2012 වර්ෂය තුලදී වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලදී. මෙම වර්ෂය තුල ක්‍රියාත්මක කරන ලද වැඩ කටයුතු පහත දක්වා ඇති අරමුණු කරා ළඟාවීමට විශාල වශයෙන් දායක විය.

- සමාජ සහ පාරිසරික ප්‍රතිලාභ තිරසාරව ලබා ගැනීම සහතික කිරීම සඳහා උපරිම වන ආවරණයක් සංරක්ෂණය සහ නඩත්තුව
- රටේ දැව අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා දැව සැපයුම ඉහළ නැංවීම උදෙසා ජාතික වන වගා ස්ථාපනය කිරීම සහ ඒවා කළමනාකරණය කිරීම.
- දැනට තිබෙන ප්‍රතිපත්තිවලට සහ නීතිරීති වලට අනුකූලව වනාන්තරවල ආරක්ෂාව ශක්තිමත් කිරීම.
- රජයේත්, ප්‍රජාවගේත් පුද්ගලික අංශයේත් සහභාගිත්වයෙන් තුරු වැස්ම ඉහළ නැංවීම.
- පර්යේෂණ, අධ්‍යාපන සහ ව්‍යාප්ති යන අංශ ඔස්සේ ජාතික වන සම්පත් සංවර්ධනය සඳහා තාක්ෂණික සහයෝගය ලබාදීම.
- ප්‍රජා වන කළමනාකරණ වැඩ කටයුතු සංවර්ධනය කිරීම.

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව ප්‍රධාන කාර්යාල මට්ටමේදී තාක්ෂණික අංශ 06 ක් යටතේ ක්‍රියාත්මක වේ. එනම්, සමාජ වන විද්‍යා සහ වන ව්‍යාප්ති ,වන සංගණන සහ කළමනාකරණ, පරිසර කළමනාකරණ, පර්යේෂණ සහ අධ්‍යාපන, වන ආරක්ෂණ සහ නීති ක්‍රියාත්මක කිරීම සහ සැලසුම් සහ ප්‍රගති පාලන යන අංශ වේ. මෙයට අමතරව දෙපාර්තමේන්තුවේ එදිනෙදා මූල්‍ය කළමනාකරණ සහ පරිපාලන කටයුතු පිළිවෙලින් මුදල් අංශය සහ පිරිස් සහ පාලන අංශය යන අංශ මගින් සිදු කරයි.

මෙම අංශ මගින් ක්‍රියාත්මක කරනු ලබන වැඩ කටයුතු පිළිබඳව දීර්ඝ තොරතුරු විස්තරයක් පහත දක්වා ඇති පරිච්ඡේද මගින් විග්‍රහ කෙරේ. මෙම ක්ෂේත්‍ර ක්‍රියාකාරකම් අම්පාර, අනුරාධපුරය, බදුල්ල, මඩකලපුව, ගාල්ල, ගම්පහ, හම්බන්තොට, කළුතර, මහනුවර, කෑගල්ල, කුරුණෑගල, මාතලේ, මාතර, මොණරාගල, නුවරඑළිය, පොළොන්නරුව, පුත්තලම, රත්නපුරය, ත්‍රිකුණාමලය, වවුනියාව, මුලතිව්, මන්නාරම සහ කිලිනොච්චි යන දිස්ත්‍රික්කයන්හි පිහිටි කාර්යාල මගින් ක්‍රියාත්මක කරනු ලැබේ. මෙම දිසාවන්ගේ කටයුතු  කොළඹ, රත්නපුරය, නුවරඑළිය සහ අනුරාධපුරය යන  දිස්ත්‍රික්කයන්හි ස්ථාපනය කර තිබෙන කළාප නියෝජ්‍ය වන සංරක්ෂක කාර්යාල මගින් අධීක්ෂණය කරනු ලැබේ.

මෙම දෙපාර්තමේන්තුවේ පුහුණු වැඩ සටහන් ශ්‍රී ලංකා වන විද්‍යායතනයේදී එහි අධ්‍යක්ෂ /  නියෝජ්‍ය වන සංරක්ෂකගේ මූලිකත්වය යටතේ සිදු කරයි.

ප්‍රධාන පර්යේෂණ නිලධාරි විසින් පර්යේෂණ කටයුතු, අධීක්ෂණය කර සම්බන්ධීකරණය කරනු ලැබේ. මෙම කටයුතු කුඹල්පොල සහ බදුල්ලෙහි පිහිටි පර්යේෂණ මධ්‍යස්ථාන ඔස්සේ ක්‍රියාත්මක වේ.

# 01 වන පරිච්ඡේදය
# සමාජ වන විද්‍යා සහ වන ව්‍යාප්ති අංශය

## 1.1 හැඳින්වීම

ජාතික මට්ටමේ ව්‍යාප්ති සහ දැනුවත් කිරීමේ වැඩ සටහන් මෙන්ම සියළුම සහභාගිත්ව සහ සමාජ වන විද්‍යා වැඩ සටහන් සංවර්ධනය සහ අධීක්ෂණය, ව්‍යාප්ති වැඩ සටහන් සැලසුම් කිරීම සහ ඒ සඳහා බීජ පැල නිෂ්පාදනය, පුහුණු හා ව්‍යාප්ති වැඩ සටහන් සඳහා අවශ්‍ය කරන මුද්‍රිත ද්‍රව්‍ය සැකසීම සහ අවට ප්‍රජාව සඳහා ප්‍රධාන මට්ටමේ ආදායම් උපදවන ව්‍යාපෘති සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම යනාදී කටයුතුවල නිරතවීම සමාජ වන විද්‍යා සහ වන ව්‍යාප්ති අංශයේ වගකීම් වේ. මෙම අංශයට සහභාගිත්ව වන වගා සහ සහභාගිත්ව වන කළමනාකරණය සඳහා අවශ්‍ය මාර්ගෝපදේශ සැකසීමද පැවරී තිබේ. ස්වභාවික වනාන්තර වල සිදු කරන ප්‍රජා කළමනාකරණ කටයුතු වල වගකීමද පැවරී තිබෙන්නේ සමාජ වන විද්‍යා සහ වන ව්‍යාප්ති අංශය වෙතය.

## 1.2 අංශයේ ප්‍රධාන කාර්ය භාරයන්

- මහජනයා සඳහා පොදු දැනුවත් කිරීමේ වැඩ සටහන් පැවැත්වීම.

- වන විද්‍යා සංවර්ධන වැඩ සටහන් පිළිබඳව විවිධ පාර්ශ්ව කණ්ඩායම් වෙත ව්‍යාප්ති සේවාවන් සැපයීම.

- මහජනයා සම්බන්ධ කර ගන්නා විවිධ රුක් රෝපණ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම.
  - ✓ ගෙවතු සංවර්ධනය.
  - ✓ සහභාගිත්ව සංරක්ෂණ රුක් රෝපණ වැඩ සටහන්.
  - ✓ මාර්ග දෙපස රුක් රෝපණය කිරීමේ වැඩ සටහන්.
  - ✓ වන වගා / කෘෂි වන වගා
  - ✓ බීජ පැල නිෂ්පාදනය.

- ස්වභාවික වන සම්පත් ආරක්ෂා කිරීමට සහ කළමනාකරණය කිරීමට සහභාගිත්ව වන කළමනාකරණ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම.

## 1.3 ආයතනික සැකැස්ම

මෙම අංශය ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය වන සංරක්ෂකවරයෙකුගේ ප්‍රධානත්වය යටතේ ක්‍රියාත්මක වේ. අංශයේ ප්‍රධාන කාර්ය භාරයන් ඉටු කිරීම සඳහා සහකාර වන සංරක්ෂකවරයෙකු ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය වන සංරක්ෂකට සහාය වේ. මෙම අංශයේ අනෙකුත් කාර්ය මණ්ඩලයට එක් වන පාලකවරයකු, එක් සන්නිවේදන සහකාරවරයෙකු, අඩවි වන නිලධාරින් දෙදෙනෙකු, එක් බීට්ටු වන නිලධාරියෙකු, වන ක්ෂේත්‍ර සහකාරවරුන් දෙදෙනෙකු, එක් කළමනාකරණ සහකාරවරියක්, සිනමා යන්ත්‍ර ක්‍රියාකරුවන් තුන් දෙනෙකු සහ කාර්යාල කාර්ය සහායකයින් දෙදෙනෙකු ඇතුලත් වේ.

## 1.4. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ප්‍රාග්ධන වියදම් අයවැය යටතේ සිදු කරනු ලබන ක්‍රියාකාරකම්

### 1.4.1 බීජ පැළ සකස් කිරීම

වන ව්‍යාප්ති කටයුතු සඳහා අවශ්‍ය කරන බීජ පැල වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ පැල තවාන් වල නිපද වන ලදි. නිපදවන ලද සම්පූර්ණ බීජ පැල සංඛ්‍යාව 1,329,400 කි.

නිපදවන ලද සම්පූර්ණ බීජ පැල සංඛ්‍යාවෙන් බීජ පැල 248,737 ක් අලෙවි කරන ලද අතර 684,255 ක් රුක් රෝපන වැඩ සටහන් සඳහා අනෙකුත් රාජ්‍ය සහ රාජ්‍ය නොවන ආයතනවලට නොමිලයේ ලබාදෙන ලදි. ඉතිරිය "දැයට සෙවණ" ජාතික රුක් රෝපණ වැඩ සටහන සහ ගෙවතු සංවර්ධන වැඩ සටහන් සඳහා යොදා ගන්නා ලදි. බීජ පැල නිෂ්පාදනය පිළිබද වැඩිදුර තොරතුරු ඇමුණුම 1 මගින් දැක්වේ.

### 1. 4. 2. දැනුවත් කිරීමේ සහ ප්‍රචාරණ වැඩ සටහන්

පහත දැක්වෙන දැනුවත් කිරීමේ සහ ප්‍රචාරණ වැඩ සටහන් අදාල කාල පරිච්ඡේදය තුල සිදු කරන ලදි. වැඩිදුර තොරතුරු වගුව 1 . 1 මගින් දැක්වේ.

**වගුව 1 . 1 දැනුවත් කිරීමේ සහ ප්‍රචාරණ වැඩ සටහන්**

| **වර්ගය** | **සංඛ්‍යාව** |
|---|---|
| දැනුවත් කිරීමේ වැඩ සටහන් | **437** |
| සම්මන්ත්‍රණ සහ වැඩමුළු | **385** |
| ප්‍රදර්ශන | **45** |
| වීඩියෝ දර්ශන | **227** |
| තරඟ සහ අනිකුත් වැඩසටහන් | **418** |
| **එකතුව** | **1512** |

### 1 . 4. 3 සහභාගිත්ව රුක් රෝපණ වැඩ සටහන්

"දැයට සෙවණ" ජාතික රුක් රෝපණ වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ වගකීම පැවරී තිබෙන ප්‍රධාන ආයතන අතුරින් එක් ආයතනයක් වන්නේ, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවයි. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව ගොවීන් සහ අනෙකුත් ප්‍රජා කණ්ඩායම් සහභාගි කර ගනිමින් බීජ පැළ 420930 ක් සිටුවා මේ සඳහා දායකත්වය සපයන

ලදී.  මෙයට අමතරව, බීජ පැළ 304000 ක් “දැයට සෙවන” වැඩසටහන යටතේ සිදුකරන පැල සිටුවීමේ කටයුතු වලට යොදා ගැනීම සඳහා සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත ලබාදෙන ලදී.

එයට අමතරව, වන ව්‍යාප්ති වැඩ සටහනේ වාර්ෂික වැඩ සැලැස්ම යටතේ පහත සඳහන් රුක් රෝපණ කටයුතු සිදු කරන ලදී. මෙම වැඩ සටහන් ප්‍රධාන වශයෙන් ඔක්තෝබර් 15 වන දින සිට නොවැම්බර් 30 දක්වා කාල පරිච්ඡේදය තුල සිදු  කරන ලදී. වැඩිදුර තොරතුරු වගුව 1.2 යටතේ දක්වා ඇත.

**වගුව 1.2  රුක් රෝපණ ක්‍රියාකාරකම්**

| **ක්‍රියාකාරකම්** | **වැඩ සටහන් සංඛ්‍යාව** |
|---|---|
| මාර්ග දෙපස රුක් රෝපණය කිරීම | **10** |
| ජලාධාරවල සහ ගං ඉවුරුවල රුක් රෝපණය කිරීම | **13** |
| පාසැල්වල රුක් රෝපණය කිරීම | **163** |
| අනෙකුත් රජයේ ආයතන සමඟ රුක් රෝපණය කිරීම | **205** |
| **එකතුව** | **391** |

### 1.4.4 නව ගොවි වන වගා ස්ථාපනය කිරීම

මෙම වර්ෂය තුල ගොවි වන වගා හෙක්ටයාර් 193 ක් ස්ථාපනය කරන ලදී. වැඩිදුර තොරතුරු ඇමුණුම II හි දැක්වේ.

### 1.4.5. පැරණි ගොවි වන වගා කළමනාකරණය කිරීම

මෙම වර්ෂය තුලදී ප්‍රජා වන වගා ව්‍යාපෘතිය සහ සහභාගිත්ව වන වගා ව්‍යාපෘතිය යටතේ ස්ථාපනය කරන ලද ගොවි වන වගා හෙක්ටයාර් 637.8 ක් විද්‍යාත්මකව කළමනාකරණය කරන ලදී.  වැඩිදුර තොරතුරු ඇමුණුම III හි දැක්වේ.

### 1.4.6 ගෙවතු සංවර්ධනය කිරීම

ගෙවතු 6609 ක් සඳහා බිජ පැල සපයාදිමෙන් සහ තාක්ෂණික සහය ලබාදීමෙන් ගෙවතු බිම් හෙක්ටයාර 583 . 9 ක් සංවර්ධනය කරන ලදී. වැඩිදුර තොරතුරු ඇමුණුම IV මගින් දැක්වේ.

### 1.4.7 වන ව්‍යාප්ති කටයුතු සඳහා අවශ්‍ය කරන මුද්‍රිත ද්‍රව්‍ය සැකසීම.

“හරිත නාගරික වනාන්තර’’ නැමති පත්‍රිකාව  සහ  වනාන්තර සුරැකිය යුත්තේ ඇයි ? සහ නිවැරදිව පැල සිටුවන්න  නැමති පත්‍රිකා දෙකද මුද්‍රණය කරන ලදී. මෙයට අමතරව  ශ්‍රී ලංකාවේ කෘෂි වන වගා නැමැති පොත්

පිංචද මෙම වසර තුල මුද්‍රණය කරන ලදි. තවද "ශ්‍රී ලංකාවේ ඖෂධිය ශාක" , " ශ්‍රී ලංකාවේ ආක්‍රමණික ශාක" සහ "ශ්‍රී ලංකාවේ විසිතුරු පුෂ්ප " යනුවෙන් වු පෝස්ටර් 3 ක් ද මෙම වසර තුලදි මුද්‍රණය කරන ලදී. රුක් සගරාවේ කලාප 3 ක් සහ "අපේ විත්ති" කලාප 3 ක් ද මෙම අංශය විසින් මුද්‍රණය කරන ලදි.

## 1.5 ප්‍රජා වන කළමනාකරණ වැඩසටහන

ශ්‍රී ලංකාවේ වියලි කලාපයේ සහ අතරමැදි කලාපයේ දිස්ත්‍රික්ක 15 ක 2012 ඔක්තෝබර් මාසයේදී ශ්‍රී ලංකා ප්‍රජා වන විද්‍යා වැඩ සටහන ආරම්භ කරන ලදී. මෙම වැඩ සටහනට ඕස්ට්‍රේලියානු මූල්‍ය ආධාර ලැබුණු අතර සියළුම සැළසුම් කටයුතු සහ සංවිධාන කටයුතු U N D P ( එක්සත් ජාතින්ගේ සංවර්ධන වැඩ සටහන) මගින් ලබා දෙන ලදී. මෙම වැඩ සටහනේ ප්‍රධාන අරමුණ වන්නේ ස්වාභාවික සම්පත් කළමනාකරණය වැඩි දියුණු කිරීම තුලින් ජීවන තත්වය නගා සිටුවා ශ්‍රී ලංකාවේ වියලි කලාපයේ සහ අතර මැදි කලාපයේ දරිද්‍රතාව පිටු දැකීමයි.

මෙම වැඩ සටහනේ ප්‍රධාන සංරචකයන් දෙකකි. ප්‍රාදේශිය ප්‍රජාව වන කළමනාකරණය සඳහා සහභාගි කරවාගෙන වන හරණය සහ වනාන්තර හායනය පහත හෙලීම සදහා ක්ෂේත්‍ර කටයුතු ක්‍රියාත්මක කිරීම මින් එක් සංරචකයකි. අනෙක් සංරචකය වන්නේ, වැඩසටහනේ අරමුණු සාක්ෂාත් කර ගැනීම උදෙසා ප්‍රජා වන විද්‍යා ප්‍රවේශයන් පිළිබදව වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයේ හැකියාව වර්ධනය කිරීමයි. පසුගිය මාස තුනක කාලය තුලදී පහත සඳහන් දිස්ත්‍රික්කවල මූලික ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කරන ලදී.

**වගුව 1.3 2010 සිට 2012 දක්වා ප්‍රජා වන කළමනාකරණ ව්‍යාපෘතිය ක්‍රියාත්මක වූ ස්ථාන**

| **දිස්ත්‍රික්කය** | **ආරම්භ කළ වර්ෂය** | **ව්‍යාපෘති ස්ථාන සංඛ්‍යාව** |
|---|---|---|
| අම්පාර | 2010 | 1 |
| | 2011 | 2 |
| | 2012 | 1 |
| අනුරාධපුර | 2010 | 5 |
| | 2011 | 0 |
| | 2012 | 3 |
| පොළොන්නරුව | 2010 | 0 |
| | 2011 | 0 |
| | 2012 | 3 |
| ත්‍රිකුණාමලය | 2010 | 0 |
| | 2011 | 0 |
| | 2012 | 1 |
| මඩකලපුව | 2010 | 0 |
| | 2011 | 0 |
| | 2012 | 1 |

| දිස්ත්‍රික්කය | ආරම්භ කළ වර්ෂය | ව්‍යාපෘති ස්ථාන සංඛ්‍යාව |
|---|---|---|
| වවුනියාව | 2010 | 0 |
| | 2011 | 0 |
| | 2012 | 2 |
| කුරුණෑගල | 2010 | 2 |
| | 2011 | 1 |
| | 2012 | 1 |
| පුත්තලම | 2010 | 2 |
| | 2011 | 1 |
| | 2012 | 1 |
| මාතලේ | 2010 | 3 |
| | 2011 | 0 |
| | 2012 | 0 |
| මොණරාගල | 2010 | 0 |
| | 2011 | 0 |
| | 2012 | 3 |
| බදුල්ල | 2010 | 1 |
| | 2011 | 2 |
| | 2012 | 4 |
| නුවරඑළිය | 2010 | 0 |
| | 2011 | 0 |
| | 2012 | 2 |
| මහනුවර | 2010 | 0 |
| | 2011 | 0 |
| | 2012 | 1 |
| රත්නපුරය | 2010 | 2 |
| | 2011 | 2 |
| | 2012 | 3 |
| හම්බන්තොට | 2010 | 0 |
| | 2011 | 0 |
| | 2012 | 1 |
| **එකතුව** | | **51** |

## 1.6 සහභාගිත්ව වෙරළබඩ කලාපීය පුනරුත්ථාපන සහ තිරසාර කළමණාකරණ ව්‍යාපෘතිය

ශ්‍රී ලංකා පශ්චාත් සුනාමි ව්‍යාපෘතියේ සහභාගිත්ව වෙරළබඩ කලාපීය පුනරුත්ථාපනය සහ තිරසාර කළමනාකරණය 2012 වර්ෂයේදී නැගෙනහිර පළාතේ ක්‍රියාත්මක කරන ලදී. ඒ අනුව, මඩකලපුව, ත්‍රිකුණාමලය, සහ අම්පාර යන දිස්ත්‍රික්කවල මෙය ක්‍රියාත්මක කරන ලදී. වසර හයක කාල පරිච්ඡේදයක් සඳහා මෙම වැඩ

සටහනට GEF සහ IFAD මගින් මුල්‍ය ආධාර සපයන ලදී. මෙම වැඩ සටහනේ අරමුණ වන්නේ, සුනාමි විපතින් බලපෑම් එල්ලවූ පරිසර පද්ධති පුනරුත්ථාපනය කර එමගින් දේශගුණික විපර්යාසවල ඉතාමත් අහිතකර තත්වයන්ට එරෙහිව අනුවර්තනය වීම සඳහා පූර්ණ පරිසර පද්ධති සේවාවක් සැපයීමයි. ඒ අනුව, හෙක්ටයාර 50 ක සහ 2 ක වෙරළබඩ ප්‍රදේශයක් පිලිවෙලින් අම්පාර සහ ත්‍රිකුණාමලය යන දිස්ත්‍රික්කවල ස්ථාපනය කිරීමට මූලික කටයුතු ආරම්භ කර තිබෙන අතර මඩකලපුව දිස්ත්‍රික්කයේ වන උද්‍යානයක්ද ස්ථාපනය කර තිබේ.

## 1.7. සුළු පරිමාණ පුද්ගලික ඉඩම් හිමියන් සඳහා පුද්ගලික වන වගා

දැව වන වගා ස්ථාපනය කිරීම කෙරෙහි සුළු පරිමාණ පුද්ගලික ඉඩම් හිමියන් දිරිමත් කිරීම සඳහා විශේෂ වැඩසටහනක් හඳුන්වා දී තිබේ. මෙම වැඩසටහන, අක්කර 05 ක් (හෙක්ටයාර් 2ක් ) දක්වා වූ ඉඩම් හිමි පුද්ගලයින් සඳහා විවෘත වේ. මෙහිදී ඉඩම් හිමියන්ට සිය ඉඩම් වල දැව වන වගාවක් ලෙස වන පැළ සිටුවීමට හෝ කෘෂි වන වගා ආකෘතියට අනුව කෘෂිකාර්මික භෝග සමග මිශ්‍ර වන පරිදි දැවමය ශාක සිටුවීමට අවස්ථාව උදා වේ. මෙහිදී වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව පළමු අක්කරය සඳහා අවශ්‍ය කරන බීජ පැළ 250 ක් නොමිළේ සපයන අතර ඉතිරිය විකුණුම් මිලෙන් 50% ක් පමණක් ගෙවා මිලදී ගත හැකිය. මෙයට අමතරව, රුක් රෝපණය සහ සියළුම පශ්චාත් නඩත්තු කටයුතු සඳහා අවශ්‍ය කරන තාක්ෂණික උපදෙස්, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සිය ව්‍යාප්ති කාර්ය මණ්ඩලය හරහා සපයනු ලැබේ. මෙම රුක් රෝපණ වැඩසටහනට සහභාගිවීම සඳහා දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වූ ඉඩම් හිමියන් වෙනුවෙන් සරල දැව ප්‍රවාහන බලපත්‍ර ක්‍රමයක් හඳුන්වා දීමට වන සංරක්ෂණ ෙදෙපාර්තමේන්තුව බලාපොරොත්තු වේ. 2012 වර්ෂය තුල ක්‍රියාත්මක කරන ලද පුද්ගලික වන වගා වැඩසටහන් තොරතුරු ඇමුණුම V මගින් දැක්වේ.

## 02 වන පරිච්ඡේදය
## වන සංගණන හා කළමනාකරණ අංශය

### 2.1 හැඳින්වීම

විවිධ වනජ නිෂ්පාදන සහ සේවාවන් සඳහා රටේ පවත්නා ඉල්ලුමට අනුව ඒවා සපුරාලන අතර වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව යටතේ පවතින වන සම්පත් සම්බන්ධයෙන් සිතියම් සැකසීම සහ සංගණන කටයුතු සිදු කිරීම සහ මෙම වන සම්පත් තිරසාරව කළමනාකරණය කිරීම වන සංගණන සහ කළමනාකරණ අංශය වෙත පැවරී තිබෙන මූලික වගකීම වේ. මෙම අංශය වනජ නිෂ්පාදනවල ගුණාත්මක බව ඉහළ නැංවීමට දායකවන අතර, වනජ නිෂ්පාදනවල ස්කන්ධභාගය සහ රාජ්‍ය භාගය භාණ්ඩාගාරය වෙත නිසි පරිදි ලැබෙන බව තහවුරු කිරීමටද බැඳී සිටියි.

### 2.2 මෙම අංශයේ මූලික අරමුණු

I වන කළමනාකරණ උපායමාර්ග සැකසීම සඳහා රටේ තිබෙන වන සම්පත් හඳුනා ගැනීමට සහ ඒවායේ පිහිටීම අවබෝධ කර ගැනීමට, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් කළමනාකරණය කරනු ලබන වනාන්තර ද ඇතුළුව, ශ්‍රී ලංකාවේ තිබෙන ස්වභාවික වනාන්තර සහ වන වගා සිතියම් ගත කිරීම.

II වනජ නිෂ්පාදන වල ගුණාත්මක බව ඉහළ නැංවීම සඳහා සිදු කලයුතු වන විද්‍යාත්මක ක්‍රියාකාරකම් සිදු කිරීමට මෙන්ම, අස්වැන්න අනුමාන කිරීමට අවශ්‍යවන වන වගාවල සංගණන දත්ත රැස් කිරීම සහ සම්පාදනය කිරීම.

III 1995 වන ක්ෂේත්‍ර මහා සැලැස්ම මගින් යෝජනා කල පරිදි ස්වභාවික වනාන්තර සහ වන වගා සඳහා කළමනාකරණ සැලසුම් සකස් කිරීම.

IV විවිධ වන වගා ශාක විශේෂ සඳහා වූ කළමනාකරණ සැලසුම් මගින් දක්වා ඇති පරිදි, වන විද්‍යාත්මක ප්‍රතිකර්ම සහ දැව හෙලීමේ කටයුතු ක්‍රියාත්මක කිරීම සහ අධීක්ෂණය.

V භායනයට පත් වූ රජයේ ඉඩම් වල නව වන වගාවන් ස්ථාපනය කිරීම.

VI නැවත වන වගා කටයුතු සහ නව වනවගා කටයුතු සිදු කිරීම සහ වයස අවුරුදු 03 ට වඩා අඩු වන වගාවල නඩත්තු කටයුතු සිදු කිරීම.

VII දෙපාර්තමේන්තුවේ භූගෝලීය තොරතුරු පද්ධතිය කළමනාකරණය සහ වැඩි දියුණු කිරීම.

VIII වන සම්පත් දත්ත පද්ධතිය ක්‍රමානුකූලව කළමනාකරණය කිරීම සහ යාවත්කාලීන කිරීම.

IX පුද්ගලික අංශයේ සංවිධාන සමග බදු ගිවිසුම් යටතේ, පයිනස් ඔලියෝ රෙසින් නිස්සාරණ කටයුතු සිදුකිරීම අධීක්ෂණය කිරීම.

X තෝරාගත් රජයේ ඉඩම් වල සිදුකරන පෞද්ගලික අංශයේ නැවත වන වගා කිරීමේ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම සහ අධීක්ෂණය කිරීම.

XI වන සම්පත් දත්ත පද්ධතිය ප්‍රතිශෝධනය කිරීම සඳහා G.P.S. උපකරණය උපයෝගීකර ගනිමින් මිණුම් කටයුතු සිදු කිරීම.

XII මිනින්දෝරු දෙපාර්තමේන්තුව මාර්ගයෙන් ස්වභාවික වනාන්තර සහ වන වගා මැනීම, මායිම් සලකුණු කිරීම, පිඹුරු සහ ඉඩම් ලැයිස්තු සැකසීම සහ ඒවායේ මායිම් වලට අදාල අංකිත දත්ත ඇතුලත් සංයුක්ත තැටි සැකසීම.

XIII කලාපීය වැවිලි සමාගම් සිය වතු වලින් දැව ලබා ගැනීම සඳහා පිළියෙල කරන ලද වන කළමනාකරණ සැලසුම් සමාලෝචනය කිරීම.

XIV වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සතු සංචාරක බංගලා කළමනාකරණය කිරීම සහ නඩත්තු කිරීම.

XV වන කළමනාකරණය, වන සංගණනය, වන සම්පත් දත්ත පද්ධතිය කළමනාකරණය, වනාන්තර සිතියම්ගත කිරීම, භූගෝලීය තොරතුරු පද්ධතිය මෙහෙයවීම, GPS උපකරණ භාවිතය, ස්කන්ධභාග ගණනය කිරීම හා කාර්යාලීය ස්වයංක්‍රීයකරණය පිළිබඳව නිලධාරීන් හට පුහුණුවීම් ලබාදීම.

## 2.3 ආයතනික සැකැස්ම

මෙම අංශය ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය වන සංරක්ෂකවරයෙකු යටතේ පවතී. මෙයට අමතරව විවිධ විෂයන් යටතේ තිබෙන කටයුතු සම්බන්ධීකරණයට සහකාර වන සංරක්ෂකවරු දෙදෙනෙකුගේ සහාය ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය වන සංරක්ෂක වෙත ලැබේ. සහකාර වන සංරක්ෂක ( 1 ) හට වන වගා පිළිබඳ තොරතුරු පද්ධතිය ( FORDATA) කළමනාකරණය කිරීම සහ යාවත්කාලීන කිරීම, වන වගා සිතියම් ගත කිරීමේ ක්‍රියාවලිය, වනාන්තර මිනුම් කිරීම සහ මායිම් සලකුණු කිරීම යන කටයුතු පැවරී තිබේ.

මෙම අංශයේ වැඩ සටහන් සහ අයවැය සැකසීම, විවිධ වන කළමනාකරණ කටයුතු වල ප්‍රගතිය අධීක්ෂණය කිරීම ඇතුළු සාමාන්‍ය පරිපාලන කටයුතු, සහකාර වන සංරක්ෂක ( 11 ) වෙත පැවරී තිබේ. මෙම කටයුතු වලට පුනර්ජනන හෙලීම්, වානිජමය තුනීකිරීම්, පූර්ව වානිජමය තුනී කිරීම්, නොමේරු වන වගා නඩත්තු කිරීම, පයිනස් ඔලියෝ රෙසීන නිස්සාරණය අධීක්ෂණය සහ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සමඟ අත්සන් කල බදු ගිවිසුම් වලට අනුකූලව පුද්ගලික අංශය විසින් සිදු කරන නැවත වන වගා කිරීම් කටයුතු අධීක්ෂණය කිරීම යනාදි කටයුතු ඇතුලත් වේ.

සෙසු කාර්ය මණ්ඩලයට සංවර්ධන සහකාරවරු 04 ක්, සැලසුම් ශිල්පීන් 08 ක්, අඩවි වන නිලධාරීන් 01 ක්, දත්ත සැපයුම්කරුවන් 01 ක්, කළමනාකාර සහකාරවරු 02 ක්, වන ක්ෂේත්‍ර සහකාරවරු 03 ක් සහ අනෙකුත් කාර්ය මණ්ඩල සාමාජිකයින් අයත් වේ. සහකාර වන සංරක්ෂකවරුන්හට ඔවුන්ගේ කාර්ය භාරය ඉටු කිරීමේදී සංවර්ධන සහකාරවරුන්ගේ සහාය ලැබේ. මැහෝගනි කළමනාකරණ සැලස්ම ක්‍රියාත්මක කිරීම සහ අධීක්ෂණය කිරීම, ස්කන්ධභාග ගණනය කිරීමේ නිරවද්‍යතාව පරීක්ෂා කිරීම සහ පැරණි වන වගා කළමනාකරණය කිරීම යන කටයුතු පැවරී තිබෙන්නේ අඩවි වන නිලධාරි වෙතය.

## 2.4 ප්‍රධාන කාර්යයන්

### 2.4.1 වන සම්පත් සිතියම්ගත කිරීම සඳහා දුරස්ථ සන්නිවේදනය

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව යටතේ පවතින වන සම්පත් (ස්වභාවික වනාන්තර සහ වන වගාවන්) යාවත්කාලීන කිරීම අඛණ්ඩව සිදු කරන ලදී. මෙම කටයුතු දිසා වන නිලධාරීන් විසින් එවනු ලබන සිතියම් සහ මිනුම් දත්ත උපයෝගි කර ගනිමින් සිදු කරන ලදී. වන කළමනාකරණ මෙහෙයුම් පහසු කරලීම සඳහා විශාල පරිමාණයේ වන කළමනාකරණ සිතියම් ( 1 : 10,000 සහ 1 : 20,000 ) යාවත්කාලීන කිරීම සඳහා විශේෂ අවධානයක් යොදවන ලදී.

### 2.4.2 වන සංගණන ක්‍රියාකාරකම්

තිරසාර අස්වැන්නක් කළමනාකරණය කිරීමට සහ අනෙකුත් කළමනාකරණ කටයුතු සඳහා උපාය මාර්ග සැලසුම් කිරීමට සම්පත් ප්‍රමාණය තක්සේරු කිරීම උදෙසා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව යටතේ පවතින ඇතැම් වනාන්තර සංගණනය කරන ලදී.

### 2.4.3 වනාන්තර මිනුම් කිරීම සහ මායිම් සලකුණු කිරීම.

භාණ්ඩාගාර අරමුදල් උපයෝගි කරගනිමින් ස්වභාවික වනාන්තර සහ වන වගා මිනුම් කිරීම සහ මායිම් සලකුණු කිරීම සිදු කරන ලදී.

### 2.4.4 වන සම්පත් දත්ත මූලාශ්‍රය කළමනාකරණය කිරීම.

වන වගාවන් සඳහා වූ පරිගණක ආශ්‍රිත මූලික දත්ත (FORDATA) මෙමගින් සපයනු ලැබේ. මෙම දත්ත ගබඩාව අඛණ්ඩව නඩත්තු කිරීම සහ යාවත්කාලීන කිරීම කරන ලදී. මෙම කටයුතු සඳහා නව ක්‍රමයක් සකස් කරන ලද අතර, මෙය වන සම්පත් කළමනාකරණ ව්‍යාපෘති ආධාර මගින් සිදු කරන ලදී. (මෙහි මනා ක්‍රියාකාරිත්වය තව දුරටත් වැඩි දියුණු කළ යුතුව ඇත.)

### 2.4.5 නැවත වන වගා කිරීම.

නැවත වන වගා කිරීම යටතේ පහත ක්‍රියාකාරකම් සිදු කරන ලදී.

- කාර්මික පරිභෝජනය සඳහා විශාල වන වගා ස්ථාපනය කිරීම.
- ආරක්ෂණ අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා වන වගා ස්ථාපනය කිරීම.
- සම්පූර්ණ හෙළීම් වලට ලක්වූ වන වගාවල නැවත වන වගා ස්ථාපනය කිරීම.
- පයිනස් වන වගා පුළුල් පත්‍ර මිශ්‍ර ශාක විශේෂ සහිත වගා බවට පරිවර්තනය කිරීම.
- ලැව් ගිනි කළමනාකරණය.
- නොමේරූ වන වගා වල වන විද්‍යාත්මක කළමනාකරණය.
- පුද්ගලික අංශයේ නැවත වන වගා කිරීමේ වැඩ සටහන ක්‍රියාත්මක කිරීම.
- මධ්‍යම කඳුකරයේ පිහිටි කඳු මුදුන් සංරක්ෂණය කිරීම.

### 2.4.6 වන විද්‍යා ප්‍රතිකර්ම සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පාලනය කිරීම සහ වන වගා වලින් අස්වැන්න ලබා ගැනීම.

FORDATA/FOAM PLAN දත්ත මූලාශ්‍රය විශ්ලේෂණය කර යම් වන වගාවකට සිදුකල යුතු වන විද්‍යාත්මක ප්‍රතිකර්ම හඳුනාගනු ලැබේ. මෙම අංශයේ වාර්ෂික කාර්ය භාරයට මෙම ප්‍රතිකර්මද ඇතුලත් කර තිබේ. මෙම කාලය තුලදී පුනර්ජනන හෙලීම් වාණිජමය තුනී කිරීම් සහ පූර්ව වාණිජමය තුනී කිරීම් යන කටයුතු රාජ්‍ය දැව සංස්ථාවේ සහාය ඇතිව සිදු කරන ලදී.

### 2.4.7 භූගෝලීය තොරතුරු පද්ධතියේ දත්ත මූලාශ්‍රය කළමනාකරණය

මෙම දත්ත මූලාශ්‍රයේ 1992 සහ 1996 LANDSAT TM චන්ද්‍රිකා ජායාරූප සහ අනෙකුත් අදාල දත්ත උපයෝගී කර ගනිමින් සකස් කල වන ආවරණය පිළිබඳ සියළුම තොරතුරු අඩංගු වේ. (ස්වභාවික වනාන්තර වල සහ වන වගා වල). මෙය වන සම්පත් කළමනාකරණයට තීරණ ගැනීමේදී අවශ්‍ය තොරතුරු සපයාදීම සඳහා භාවිතා කරන ලදී.

### 2.4. 8 වනාන්තර වල මංපෙත් සහ මාර්ග නඩත්තු කිරීම

සියළුම වන ක්‍රියාකාරකම් වඩාත් හොඳින් ක්‍රියාත්මක කිරීම සඳහා, ප්‍රවේශය පහසු කිරීමට වනාන්තර මාර්ග නඩත්තු කිරීම අත්‍යාවශ්‍ය කරුණකි. ඒ අනුව වන කළමනාකරණ සැලසුම් ක්‍රියාත්මක කිරීම මනාව නඩත්තු කල මාර්ග ඇති විට පහසු වේ. පුනර්ජනන හෙලීම් සිදු කරන ප්‍රදේශ වල නව, වන මාර්ග නිර්මාණයේදි සහ ඉදි කිරීමේදී පරිසර ආරක්ෂණ පියවර පිළිබඳව ඉතාමත් දැඩිව සලකා බලන ලදී.

### 2.4.9 රාජ්‍ය දැව සංස්ථාව සමඟ සම්බන්ධීකරණ කටයුතු වල නිරත වීම

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සතු වන වගා වලින් දැව ලබා ගැනීමට බලය ලබාදී තිබෙන්නේ රාජ්‍ය දැව සංස්ථාව වෙත බැවින්, මෙම ආයතන දෙක අතර මනා සම්බන්ධතාවයක් වසර පුරාම පවත්වා ගන්නා ලදී. රාජ්‍ය දැව සංස්ථාව විසින් ගෙවිය යුතු ස්කන්ධභාගය ක්‍රමානුකූලව ගණනය කිරීම සහ අය කිරීම, රාජ්‍ය වන වගා වලින් කපා ගන්නා ලද දැව ප්‍රමාණය අනුව සිදු කරන ලදී.

### 2.4.10 පයිනස් ඔලියො - රෙසින් නිස්සාරණ කටයුතු ක්‍රියාත්මක කිරීම

පයිනස් ඔලියො රෙසින් නිස්සාරණය සඳහා තෝරාගත් පෞද්ගලික අංශයේ සමාගම් වලට, පරිණත කැරීබියානු පයිනස් වන වගා බදුදීම හා එම කටයුතු පාලනය පිළිබඳ වගකීම් භාරව තිබෙන්නේ මෙම අංශය වෙතය.

## 2.5 2012 වසර තුල සිදු කල ක්‍රියාකාරකම්වල ප්‍රගතිය

### 2.5.1 නැවත වන වගා කිරීමේ වැඩ සටහන

මෙම කාල පරිච්ඡේදය තුල, මෙම ක්‍රියාකාරකම යටතේ වන වගා හෙක්ටයාර් 851.7 ක් පූර්ණ හෙළීම් සිදු කල ප්‍රදේශ තුල ස්ථාපනය කරන ලදී. මෙම වැඩ සටහන පිළිබඳ වැඩිදුර තොරතුරු වගුව 2.1 මගින් දැක්වේ.

**වගුව : 2.1. නැවත වන වගා කිරීමේ වැඩ සටහන - 2012**

| දිස්ත්‍රික්කය | පැරණි විශේෂ | නව විශේෂ | ඉලක්කය (හෙක්ටයාර්) | ප්‍රගතිය (හෙක්ටයාර්) |
|---|---|---|---|---|
| අම්පාර | තේක්ක | කායා<br>කායා / තේක්ක | 30<br>30 | 30<br>30 |
| අනුරාධපුර | තේක්ක | කායා<br>තේක්ක | 30.8<br>79.2 | 51.8<br>65 |
| පොළොන්නරුව | තේක්ක | කායා | 52 | 52 |
| මඩකලපුව | තේක්ක | කායා | 50 | 50 |
| ත්‍රිකුණාමලය | තේක්ක | කායා | 50 | 50 |
| වවුනියාව | තේක්ක | තේක්ක | 20 | 18 |
| රත්නපුරය | පයිනස් | ඉයුකැලිප්ටස් ග්‍රාන්ඩිස් | 25 | 25 |
| මාතර | පයිනස් | හොර | 21.3 | 21.2 |
| මාතලේ | තේක්ක | කායා | 40 | 37 |
| මොණරාගල | තේක්ක | තේක්ක<br>කායා | 31.5<br>7.2 | 31.2<br>7.2 |
| බදුල්ල | ඉයුකැලිප්ටස්<br>ඉයුකැලිප්ටස් | ඉයුකැලිප්ටස්<br>තේක්ක | 49.2<br>20 | 59.1<br>20 |
| නුවරඑළිය | ඉයුකැලිප්ටස්<br>පයිනස් | ඉයුකැලිප්ටස් | 83.5 | 84.4 |

| දිස්ත්‍රික්කය | පැරණි විශේෂ | නව විශේෂ | ඉලක්කය (හෙක්ටයාර්) | ප්‍රගතිය (හෙක්ටයාර්) |
|---|---|---|---|---|
| මහනුවර | පයිනස් | ඉයුකැලිප්ටස්<br>හොර/ගොරකා | 8<br>19 | 8<br>27.5 |
| කළුතර | පයිනස්<br>ඇකේෂියා | හොර | 58 | 58 |
| කුරුණෑගල | තේක්ක | කායා<br>තේක්ක | 74.9<br>20.7 | 90.4<br>20.7 |
| ගම්පහ | තේක්ක | තේක්ක | 15.2 | 15.2 |
| **එකතුව** | | | **815.5** | **851.7** |

### 2.5.2. බීජ පැල නිෂ්පාදනය

ඉහත නැවත වන වගා කිරීමේ වැඩ සටහන සඳහා බීජ පැල 1,804,672 ක් නිෂ්පාදනය කරන ලදී. වැඩිදුර තොරතුරු වගුව 2.2 මගින් දැක්වේ. නැවත වන වගා කිරීම සඳහා තේක්ක, කායා, ඉයුකැලිප්ටස් සහ හොර යන ශාක විශේෂ ප්‍රධාන වශයෙන් යොදා ගන්නා ලදී.

**වගුව 2.2 බීජ පැල නිෂ්පාදනය - 2012**

| දිස්ත්‍රික්කය | විශේෂ | බීජ පැල සංඛ්‍යාව |
|---|---|---|
| අම්පාර | *කායා* | **140,800** |
| අනුරාධපුරය | *කායා / තේක්ක* | **427,859** |
| පොළොන්නරුව | *කායා* | **91,500** |
| මඩකලපුව | *කායා* | **102,500** |
| ත්‍රිකුණාමලය | *කායා* | **132,750** |
| වව්නියාව | *කායා* | **35,000** |
| රත්නපුරය | *ඉයුකැලිප්ටස් ග්‍රාන්ඩිස්* | **40,000** |
| මාතර | *හොර* | **37,000** |
| මාතලේ | *කායා* | **70,400** |

| දිස්ත්‍රික්කය | විශේෂ | බීජ පැල සංඛ්‍යාව |
|---|---|---|
| මොණරාගල | *තේක්ක*<br>*කායා* | 56,970<br>13,147 |
| බදුල්ල | *ඉයුකැලිප්ටස්*<br>*තේක්ක* | 89,590<br>40,800 |
| නුවරඑළිය | *ඉයුකැලිප්ටස්* | 239,000 |
| මහනුවර | *ඉයුකැලිප්ටස් / හොර / කොස්* | 47,000 |
| ගම්පහ | *තේක්ක* | 27,000 |
| කළුතර | *හොර* | 45,100 |
| කුරුණෑගල | *කායා*<br>*තේක්ක* | 131,824<br>36,432 |
| **එකතුව** | | **1,804,672** |

### 2.5.3. වන වගා නඩත්තු කිරීම

#### 2.5.3.1. නොමේරූ වන වගා නඩත්තු කිරීම

වන වගා නඩත්තු කිරීමේ වැඩ සටහන යටතේ වල් නෙලීම, පොහොර යෙදීම, ලැව් ගිනි වැලැක්වීම හා පාළු පැල සිටුවීම සිදු කරන ලදී. අදාල වර්ෂය තුල හෙක්ටයාර් 2,819.91 ක් නඩත්තු කරන ලදී. මේ පිළිබඳ වැඩි විස්තර වගුව 2.3 මගින් දැක්වේ.

වගුව 2.3. නොමේරූ වන වගා නඩත්තු කිරීම - 2012

| දිස්ත්‍රික්කය | 2009 වසරේ ස්ථාපිත වසර 03ක් වයසැති වන වගා ප්‍රමාණය (හෙක්ටයාර) | | | 2010 වසරේ ස්ථාපිත වසර දෙකක් වයසැති වන වගා (හෙක්ටයාර) | | | 2011 වසරේ ස්ථාපිත වසරක් වයසැති වන වගා (හෙක්ටයාර) | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | විශේෂ | ඉලක්කය (හෙක්) | ප්‍රගතිය (හෙක්) | විශේෂ | ඉලක්කය (හෙක්) | ප්‍රගතිය (හෙක්) | විශේෂ | ඉලක්කය ( හෙක්) | ප්‍රගතිය (හෙක්) |
| කුරුණෑගල | *තේක්ක/ කායා* | 107.40 | 107.40 | *තේක්ක/ කායා* | 92.30 | 92.30 | *තේක්ක* | 102.59 | 102.59 |
| පුත්තලම | - | - | - | *කායා* | 69.00 | 69.00 | *තේක්ක/ කායා* | 31.50 | 31.50 |
| කළුතර | - | - | 8.75 | *හොර* | 40.50 | 40.50 | *හොර* | 42.00 | 44.00 |
| අනුරාධපුරය | *තේක්ක/කායා.* | 113.00 | 113.00 | *තේක්ක/ කායා* | 119.40 | 119.40 | *කායා* | 87.40 | 87.40 |
| අම්පාර | *තේක්ක /කායා* | 102.00 | 102.00 | *තේක්ක / කායා* | 109.00 | 109.00 | *තේක්ක /කායා* | 100.00 | 100.00 |
| පොළොන්නරුව | *තේක්ක / කායා* | 103.00 | 103.00 | *කායා* | 50.00 | 50.00 | *කායා* | 50.00 | 50.00 |
| ත්‍රිකුණාමලය | - | - | - | - | - | - | *කායා* | 50.00 | 50.00 |
| මඩකලපුව | - | - | - | - | - | - | *කායා* | 50.00 | 50.00 |
| මහනුවර | - | - | - | *හොර/ කොස් /දූන් මිශ්‍ර සහ ඉයුකැලිප්ටස්* | 37.00 | 23.00 | *හොර/ කොස් /දූන් මිශ්‍ර සහ ඉයුකැලිප්ටස්* | 30.50 | 30.50 |
| නුවරඑළිය | *ඉයුකැලිප්ටස්* | 154.4 | 267.5 | *ඉයුකැලිප්ටස්* | 101.5 | 91.5 | *ඉයුකැලිප්ටස්* | 132.37 | 145.37 |
| මොණරාගල | - | - | - | *තේක්ක / කායා* | 83.40 | 83.40 | *තේක්ක/ කායා* | 105.50 | 105.00 |

| දිස්ත්‍රික්කය | 2009 වසරේ ස්ථාපිත වසර 03ක් වයසැති වන වගා ප්‍රමාණය (හෙක්ටයාර) | | | 2010 වසරේ ස්ථාපිත වසර දෙකක් වයසැති වන වගා (හෙක්ටයාර) | | | 2011 වසරේ ස්ථාපිත වසරක් වයසැති වන වගා (හෙක්ටයාර) | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | විශේෂ | ඉලක්කය (හෙක්) | ප්‍රගතිය (හෙක්) | විශේෂ | ඉලක්කය (හෙක්) | ප්‍රගතිය (හෙක්) | විශේෂ | ඉලක්කය ( හෙක්) | ප්‍රගතිය (හෙක්) |
| මාතලේ | *තේක්ක / කුඹුක්* | 80.40 | 80.00 | *තේක්ක / කායා* | 45.00 | 45.00 | *කායා* | 34.00 | 34.00 |
| බදුල්ල | *ඉයුකැලිප්ටස් කායා/ තේක්ක* | 143.00 | 143.00 | *ඉයුකැලිප්ටස් / කායා / තේක්ක* | 125.50 | 125.00 | *තේක්ක /ඉයුකැලිප්ටස්* | 75.20 | 75.20 |
| රත්නපුර | තේක්ක කායා | 34.00 | 34.00 | *තේක්ක/ කායා* | 61.30 | 61.30 | *තේක්ක ඉයුකැලිප්ටස්* | 44.50 | 44.50 |
| මාතර | *හොර* | 1.80 | 1.80 | - | - | - | - | - | - |
| **එකතුව** | | **839.00** | **960.45** | | **933.90** | **909.40** | | **935.56** | **950.06** |

### 2.5.4. වන වගාවල වන විද්‍යාත්මක ප්‍රතිකර්ම සිදු කිරිම.

අදාල කාල පරිච්ජේදය තුලදී තෝරාගත් ඇතැම් වන වගා තුල පහත සදහන් වන විද්‍යාත්මක ප්‍රතිකර්ම සිදු කරන ලදී.

- පූර්ව වාණිජමය තුනී කිරීම්
- වානිජමය තුනී කිරීම්
- පශ්චාත් දැව හෙළීම් සංගණනය
- රිකිලි නඩත්තු කිරීම
- රිකිලි කළමනාකරණය
- ශුද්ධ කිරීම
- ආරෝහක කැපීම
- මැහෝගනි වන වගා කළමනාකරණය

### 2.5.4.1 පූර්ව වාණිජමය තුනී කිරීම්

දිස්ත්‍රික්ක 11 ක තේක්ක, ඉයුකැලිප්ටස්, සහ කායා වන වගා වල පූර්ව වානිජමය තුනී කිරීම් සිදු කරන ලදී. වැඩිදුර තොරතුරු වගුව 2.4 මගින් දැක්වේ.

වගුව 2.4 පූර්ව වාණිජමය තුනී කිරීම් - 2012

| **දිස්ත්‍රික්කය** | **විශේෂ** | **ඉලක්කය (හෙක්ටයාර්)** | **ප්‍රගතිය (හෙක්ටයාර)** |
|---|---|---|---|
| හම්බන්තොට | තේක්ක | 90.50 | 90.50 |
| බදුල්ල | *තේක්ක / ඉයුකැලිප්ටස්* | 64.00 | 64.00 |
| නුවරඑළිය | *ඉයුකැලිප්ටස්* | 163.00 | 173.90 |
| මොණරාගල | *තේක්ක / කායා* | 91.00 | 107.50 |
| මහනුවර | *ඉයුකැලිප්ටස්* | 30.00 | 30.00 |
| අම්පාර | *තේක්ක*<br>*කායා* | 32.50 | 32.50 |
| අනුරාධපුර | *තේක්ක* | 100.40 | 100.40 |
| පොළොන්නරුව | *තේක්ක / කායා* | 137.00 | 137.00 |
| මුලතිව් | *තේක්ක* | 45.00 | 55.00 |
| කුරුණෑගල | *තේක්ක / කායා* | 9.80 | 9.80 |
| පුත්තලම | *තේක්ක / කායා* | 69.00 | 69.00 |
| **එකතුව** | | **832.20** | **869.60** |

### 2.5.4.2 වාණිජමය තුනී කිරීම්

ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක 04 ක තේක්ක, කායා සහ ඉයුකැලිප්ටස් වන වගා වල වානිජමය තුනී කිරීම් සිදු කරන ලදී. වැඩි දුර තොරතුරු වගුව 2.5 මගින් දැක්වේ.

වගුව 2.5  වාණිජමය තුනී කිරීම් - 2012

| දිස්ත්‍රික්කය | විශේෂ | ඉලක්කය (හෙක්ටයාර්) | ප්‍රගතිය (හෙක්ටයාර) |
|---|---|---|---|
| අනුරාධපුරය | *කායා* | 16.80 | 16.80 |
| බදුල්ල | *ඉයුකැලිප්ටස්* | 200.00 | 199.90 |
| නුවරඑළිය | *ඉයුකැලිප්ටස්* | 200.00 | 210.10 |
| හම්බන්තොට | තේක්ක | 62.00 | 62.00 |
| **එකතුව** | - | **478.00** | **488.8** |

### 2.5.4.3 පරිණත වගාවල පුනර්ජනන හෙලීම්

මෙම ක්‍රියාකාරකමට වන වගාවල සිදු කරන පුනර්ජනන හෙලීම් (වගුව 2. . 1) සහ රිකිලි කළමනාකරණය කිරීම සඳහා වියළි කලාපයේ ඉයුකැලිප්ටස් වන වගා වල සිදු කරන පුනර්ජනන හෙලීම් ( වගුව 2.8) අයත්වේ. උඩරට ඇතැම් ඉයුකැලිප්ටස් වන වගා පූර්ණ හෙලීම් සිදුකළ අතර වඩා සුදුසු ඉයුකැලිප්ටස් විශේෂ නැවත වගා කරන ලදී. තෝරාගත් ඇතැම් පරිණත පයිනස් වන වගාද පූර්ණ හෙලීම් වලට ලක් කර, එම ඉඩම් වල කායා, හොර, ඉයුකැලිප්ටස් සහ මිශ්‍ර ශාක විශේෂ වගා කරන ලදී. වියළි කලාපයේ තේක්ක වන වගා හෙලීමෙන් පසුව නැවතත් තේක්ක සිටුවන ලදී. කෙසේ වුවද අලින්ගේ තර්ජනයට නිරතුරුවම භාජනය වන ප්‍රදේශ වල තේක්ක වෙනුවට කායා වගා කරන ලදී. මෙම කටයුතු ඉයුකැලිප්ටස්, පයිනස් සහ තේක්ක කළමනාකරණ සැලසුම් වලට අනුව සිදු කරන ලදී.

### 2.5.4.4. පශ්චාත් හෙලීම් සංගණන

වන වගාවල වානිජමය තුනී කිරීම සහ පූර්ව වාණිජමය තුනී කිරීම් සිදු කිරීමෙන් පසු පශ්චාත් හෙලීම් සංගණන සිදු කරන ලදී. (වගුව 2.6)

**වගුව 2.6 පශ්චාත් හෙළීම් සංගණනය - 2012**

| දිස්ත්‍රික්කය | පශ්චාත් හෙළීම් සංගණන | | |
|---|---|---|---|
| | විශේෂය | ඉලක්කය (හෙක්.) | ප්‍රගතිය (හෙක්.) |
| බදුල්ල | *ඉයුකැලිප්ටස්* | 130.95 | 117.50 |
| නුවරඑළිය | *ඉයුකැලිප්ටස්* | 241.80 | 241.8 |
| මොණරාගල | *තේක්ක* | - | 74.40 |
| හම්බන්තොට | *තේක්ක* | 62.00 | - |
| **එකතුව** | | **434.75** | **433.70** |

### 2.5.4.5. රිකිලි නඩත්තු කිරීම

මෙම නඩත්තු කටයුතු පහත පරිදි සිදු කරන ලදී. ( වගුව 2.7)

**වගුව 2.7 රිකිලි නඩත්තු කිරීම - 2012**

| දිස්ත්‍රික්කය | විශේෂ | ඉලක්කය (හෙක්.) | ප්‍රගතිය (හෙක්.) |
|---|---|---|---|
| පොලොන්නරුව | *ඉයුකැලිප්ටස්* | 140.62 | 141.04 |
| බදුල්ල | *ඉයුකැලිප්ටස්* | 65.1 | 65.1 |
| **එකතුව** | | **205.72** | **206.14** |

### 2.5.4.6 රිකිලි කළමනාකරණය කිරීම

රිකිලි කළමනාකරණ කටයුතු පහත පරිදි සිදු කරන ලදී. (වගුව 2.8)

**වගුව 2.8 රිකිලි කළමනාකරණය 2012**

| **දිස්ත්‍රික්කය** | **විශේෂ** | **ඉලක්කය (හෙක්.)** | **ප්‍රගතිය (හෙක්.)** |
|---|---|---|---|
| පුත්තලම | *ඉයුකැලිප්ටස්* | 30 | 30 |
| අම්පාර | *ඉයුකැලිප්ටස්* | 25 | 25 |
| පොළොන්නරුව | *ඉයුකැලිප්ටස්* | 23 | 23 |
| **එකතුව** | | **78** | **78** |

### 2.5.4.7 ශුද්ධ කිරීම

පහත දැක්වෙන පරිදි හෙක්ටයාර් 495.6 ක ශුද්ධ කිරීමේ කටයුතු සිදු කරන ලදී. (වගුව 2.9)

**වගුව 2.9 ශුද්ධ කිරීම - 2012**

| **දිස්ත්‍රික්කය** | **ශුද්ධ කිරීම** | |
|---|---|---|
| | **ඉලක්කය (හෙක්.)** | **ප්‍රගතිය (හෙක්.)** |
| හම්බන්තොට | 81.5 | 293.00 |
| රත්නපුර | - | 16.20 |
| බදුල්ල | - | 20.00 |
| මහනුවර | 25.00 | 30.00 |
| මාතලේ | 25.00 | 40.00 |
| කුරුණෑගල | 47.60 | 75.40 |
| අනුරාධපුරය | - | 21.00 |
| **එකතුව** | **179.1** | **495.6** |

### 2.5.4.8 ආරෝහක කැපීම.

**වගුව 2.10 ආරෝහක කැපීම - 2012**

| දිස්ත්‍රික්කය | ආරෝහක කැපීම | |
|---|---|---|
| | ඉලක්කය (හෙක්.) | ප්‍රගතිය (හෙක්.) |
| හම්බන්තොට | 81.50 | 118.00 |
| **එකතුව** | 81.50 | 118.00 |

### 2.5.4.9 මැහෝගනී වන වගා කළමනාකරණය

අදාල වර්ෂය තුලදී හෙක්ටයාර් 495.2 ක මැහෝගනි කළමනාකරණ සැලැස්මට අනුව වන විද්‍යාත්මක ප්‍රතිකර්ම, යටි වගාව මගින් සුපෝෂණ කටයුතු සිදුකිරීම හා ආරෝහක කැපීම සිදු කරන ලදී. මේ පිළිබද වැඩි දුර තොරතුරු වගුව 2.11 මගින් දැක්වේ.

**වගුව : 2.11 මැහෝගනී වන වගා කළමනාකරණය කිරීම – 2012**

| දිස්ත්‍රික්කය | සිදු කරන ලද ක්‍රියාකාරකම් | ඉලක්කය (හෙක්.) | ප්‍රගතිය (හෙක්.) |
|---|---|---|---|
| කුරුණෑගල | මැහෝගනී ආරෝහක කැපීම | 209.00 | 209.00 |
| ගම්පහ | නඩත්තු කටයුතු | 116.00 | 106.00 |
| | යටි වගාව මගින් සුපෝෂණය | | 10.00 |
| කෑගල්ල | වන විද්‍යාත්මක ප්‍රතිකර්ම | 125.00 | 170.2 |
| **එකතුව** | | **450.00** | **495.2** |

### 2.5.5 සිතියම් සකස් කිරීම

භූමියේ සිදු කරන ලද මිණුම් පාදක කර ගනිමින් නව වන වගා සිතියම් ගත කරන ලදී. මේවා 1:20,000 පරිමාණයට පරිවර්ථනය කරන ලදී. මෙම තොරතුරු 2. 12 වගුව මගින් දැක්වේ.

**වගුව : 2.12 GPS සහ ප්‍රිස්මේන්තු කොම්පාසු උපයෝගි කර ගනිමින් සිදු කරන ලද වන වගා වල මිණුම්**

| **දිස්ත්‍රික්කය** | **ඉලක්කය (හෙක්.)** | **ප්‍රගතිය (හෙක්.))** |
|---|---|---|
| පුත්තලම | 210.00 | 211.00 |
| කුරුණෑගල | 331.00 | 331.00 |
| කළුතර | 80.4 | 84.00 |
| අනුරාධපුරය | 100.00 | 99.73 |
| අම්පාර | 300.00 | 420.00 |
| මුලතිව් | 500.00 | 500.00 |
| ත්‍රිකුණාමලය | 2.00 | 9.70 |
| නුවරඑළිය | 150.00 | 1504.20 |
| මොණරාගල | 300.00 | 974.30 |
| බදුල්ල | 800.00 | 800.00 |
| මාතලේ | 65.00 | 67.00 |
| මහනුවර | 180.00 | 180.00 |
| **එකතුව** | **3018.40** | **5180.93** |

### 2.5.6. ස්වාරක්ෂක කලාපීය වන වගා ස්ථාපනය කිරීම සහ පරිහානියට පත් වන වගා පුනරුත්තාපනය කිරීම - 2012

හෙක්ටයාර 20ක භූමි ප්‍රමාණයක ස්වාරක්ෂක කලාපීය වන වගා ස්ථාපනය කරන ලද අතර, 2012 වසර තුලදී පරිහානියට පත් වූ වන වගා හෙක්ටයාර 25ක් පුනරුත්ථාපනය කරන ලදී. වැඩිදුර තොරතුරු 2.13 වගුව මගින් දැක්වේ.

**වගුව 2.13 ස්වාරක්ෂක කලාපීය වන වගා ස්ථාපනය කිරීම සහ පරිහානියට පත් වන වගා පුනරුත්තාපනය කිරීම - 2012**

| දිස්ත්‍රික්කය | ස්වාරක්ෂක කලාපීය වන වගා | | පරිහානියට පත් වන වගා පුනරුත්ථාපනය කිරීම | |
|---|---|---|---|---|
| | ඉලක්කය (හෙක්.) | ප්‍රගතිය (හෙක්.) | ඉලක්කය (හෙක්.) | ප්‍රගතිය (හෙක්.) |
| පුත්තලම | | | 25 | 25 |
| කුරුණෑගල | 20 | 20 | | |
| **එකතුව** | **20** | **20** | **25** | **25** |

## 2. 5. 7. සුපෝෂණ වන වගා නඩත්තු කිරීම - 2012

හෙක්ටයාර් 35 ක සුපෝෂණ වන වගා නඩත්තු කරන ලදි. මෙම ක්‍රියාකාරකම පිළිබඳ වැඩිදුර තොරතුරු 2.14 වන වගුව මගින් දැක්වේ

**වගුව 2.14 – සුපෝෂණ වන වගා නඩත්තු කිරීම - 2012**

| දිස්ත්‍රික්කය | ඉලක්කය (හෙක්.) | ප්‍රගතිය (හෙක්.) |
|---|---|---|
| රත්නපුරය | 25 | 25 |
| පොළොන්නරුව | 10 | 10 |
| **එකතුව** | **35** | **35** |

## 2.5.8. මිණුම් කිරීම සහ මායිම් සලකුණු කිරීම

සිදුකරන ලද ක්‍රියාකාරකම් වල තොරතුරු 2.15 වගුව මගින් දැක්වේ.

**වගුව 2.15 මිණුම් කිරීම සහ මායිම් සලකුණු කිරීම.**

| දිස්ත්‍රික්කය | ඉලක්කය (කි.මී.) | ප්‍රගතිය (කි.මී.) |
|---|---|---|
| මාතර | 30.00 | - |
| රත්නපුරය | 60.00 | 60.00 |
| ත්‍රිකුණාමලය | 20.00 | 36.00 |
| මඩකලපුව | 10.00 | 10.75 |

| දිස්ත්‍රික්කය | ඉලක්කය (කි.මී.) | ප්‍රගතිය (කි.මී.) |
|---|---|---|
| මන්නාරම | 10.00 | 10.00 |
| කිලිනොච්චි | 10.00 | 10.00 |
| මුලතිව් | 10.00 | 15.00 |
| මහනුවර | 20.00 | 20.00 |
| මොණරාගල | 30.00 | 33.50 |
| කුරුණෑගල | 20.00 | 25.40 |
| කළුතර | 20.00 | 21.90 |
| **එකතුව** | **240.00** | **242.55** |

### 2.5.9. මධ්‍යම කඳුකරයේ කඳු මුදුන් සංරක්ෂණය කිරීම - වන වගා ස්ථාපනය කිරීම

පහත සදහන් දිස්ත්‍රික්ක වල හෙක්ටයාර 10 ක භූමි ප්‍රමාණයක වන වගා ස්ථාපනය කර සංරක්ෂණය කරන ලදි. (වගුව 2.16)

**වගුව 2.16 මධ්‍යම කඳුකරයේ කඳු මුදුන් සංරක්ෂණය කිරීම.**

| දිස්ත්‍රික්කය | ඉලක්කය (කි.මී.) | ප්‍රගතිය (කි.මී.) |
|---|---|---|
| රත්නපුරය | - | 5.00 |
| කෑගල්ල | - | 5.00 |
| **එකතුව** | - | **10.00** |

### 2. 5. 9. 1. මධ්‍යම කඳුකරයේ කඳු මුදුන් නඩත්තු කිරීම

මුහුදු මට්ටමේ සිට මීටර් 1200 කට ඉහලින් මධ්‍යම කදුකරයේ පිහිටියාවුද, 2011 වසරේදී ස්ථාපනය කරන ලද්දාවුද හෙක්ටයාර 321ක භූමි ප්‍රමාණයක පහත සදහන් දිස්ත්‍රික්කයන්හි වන වගා නඩත්තු කරන ලදි. (වගුව 2.17)

**වගුව 2.17 : මධ්‍යම කඳුකරයේ කඳු මුදුන්හි 2011 වසරේදී ස්ථාපනය කරන ලද වන වගා නඩත්තු කිරීම.**

| **දිස්ත්‍රික්කය** | **ඉලක්කය (හෙක්)** | **ප්‍රගතිය (හෙක්.)** |
|---|---|---|
| නුවරඑළිය | 120 | 120 |
| බදුල්ල | 151 | 151 |
| මහනුවර | 20 | 20 |
| රත්නපුරය | 20 | 20 |
| කෑගල්ල | 10 | 10 |
| **එකතුව** | **321** | **321** |

2010 වසරේදී ස්ථාපනය කරන ලද මුහුදු මට්ටමේ සිට මීටර් 1200 කට ඉහලින් මධ්‍යම කදුකරයේ පිහිටි, හෙක්ටයාර 321ක භූමි ප්‍රමාණයක පහත සදහන් වන වගා නඩත්තු කරන ලදි. (වගුව 2.18)

**වගුව 2.18 : මධ්‍යම කඳුකරයේ කඳු මුදුන්හි 2010 වසරේදී ස්ථාපනය කරන ලද වන වගා නඩත්තු කිරීම.**

| **දිස්ත්‍රික්කය** | **ඉලක්කය (හෙක්)** | **ප්‍රගතිය (හෙක්.)** |
|---|---|---|
| නුවරඑළිය | 5.5 | 5.5 |
| බදුල්ල | 12.0 | 25.0 |
| **එකතුව** | **17.5** | **30.5** |

## 2.5.10. වන වගා වල මාර්ග නඩත්තු කිරීම

වගුව 2.19 මගින් දක්වා ඇති පරිදි වන වගා වල මාර්ග කි.මී. 24.5 ක් නඩත්තු කරන ලදී.

**වගුව 2.19 වන වගා වල මාර්ග නඩත්තු කිරීම - 2012**

| **දිස්ත්‍රික්කය** | **ඉලක්කය (කි.මී.)** | **ප්‍රගතිය (කි.මී.)** |
|---|---|---|
| හම්බන්තොට | 19.5 | 19.5 |
| මහනුවර | 5.0 | 5.0 |
| **එකතුව** | **24.5** | **24.5** |

### 2.5.11. පයිනස් වන වගා බිම් වලින් ඔලියො රෙසින් නිස්සාරණය කිරීම.

පහත සඳහන් පුද්ගලික අංශයේ සංවිධාන පහ, සිය වාණිජ මට්ටමේ රෙසින් නිස්සාරණය කිරීමේ ගිවිසුම් දීර්ඝ කරන ලදී. වැඩිදුර තොරතුරු වගුව 2.20 මගින් දැක්වේ.

i. කොනිෆර් ප්‍රොඩක්ට්ස් ප්‍රොසෙසින් (පුද්ගලික) සමාගම
ii. ඔරියන්ටල් රෙසින් (පුද්ගලික) සමාගම
iii. පයනියර් ලංකා පයිනස් (පුද්ගලික) සමාගම
iv. ජේ.සී.ටී. කෙමිකල්ස් (පුද්ගලික) සමාගම
v. චිලව් මෝබයිල්

වගුව 2.20 **බදු දුන් ඉඩම් ප්‍රමාණය සහ බදු ආදායම - 2012**

| සංවිධානයේ නම | බදු දුන් ඉඩම් ප්‍රමාණය (හෙක්.) | බදු ආදායම (රුපියල්) |
|---|---|---|
| 1. කොනිෆර් ප්‍රොඩක්ට්ස් ප්‍රොසෙසින් (පුද්) සමාගම | 237.80 | 996,019.00 |
| 2. පයනියර් ලංකා පයිනස් (පුද්) සමාගම | 1345.90 | 4282796.30 |
| 3. ඔරියන්ටල් රෙසින්ස් (පුද්) සමාගම | 1127.94 | 3712107.25 |
| 4. ජේ.සී.ටී. කෙමිකල්ස් (පුද්) සමාගම | 299.10 | 938276.70 |
| 5. චිලව් මෝබයිල් | 35.00 | 232925.00 |
| **එකතුව** | **3045.74** | **10162124.25** |

### 2.5.12. 2012 වසර සඳහා රාජ්‍ය භාණ්ඩාගාරයට ගෙවිය යුතු ස්කන්ධ භාගය

2012 වසර සඳහා රාජ්‍ය දැව සංස්ථාව විසින් රාජ්‍ය භාණ්ඩාගාරයට ගෙවිය යුතු සම්පූර්ණ ස්කන්ධ භාගය රු. 863141696.56 කි. මෙයට පැරණි වන වගා කළමනාකරණ තුලින් ලබාගත් දැව (රු. 80356784.39 ) පුනර්ජනන හෙලීම් මගින් ලබාගත් දැව (රු 781561865.54) සහ වන අපරාධ වලින් අත්පත් කර ගෙන රාජ්‍ය දැව සංස්ථාවට ලබාදුන් දැව (රු.1223046.63 ) අයත් වේ.

### 2.5.13. පෞද්ගලික අංශයේ නැවන වන වගා කිරීම.

පෞද්ගලික අංශයේ සම්පත්, වන වගා සංවර්ධනයට උපයෝගි කර ගැනීමේ අරමුණින් පෞද්ගලික අංශයේ නැවත වන වගා කිරීමේ වැඩ සටහන නිර්මාණය කර තිබේ. මෙම වැඩ සටහනේ අදියර දෙක 2000 වසරේදී සහ 2002 වසරේදී දියත් කරන ලදී. 2012 වසරේදී පුද්ගලික අංශය සමග ඇති කර ගත් ගිවිසුම් 2.21 වගුව මගින් දැක්වේ.

**වගුව : 2.21 2012 වසරේ පුද්ගලික අංශයේ නැවත වන වගා කිරීමේ වැඩ සටහනේ තත්වය**

| දිස්ත්‍රික්කය | අඩවිය | ගිවිසුම් අංකය | විශේෂය | අදියර | | ප්‍රමාණය (හෙක්.) |
|---|---|---|---|---|---|---|
| | | | | I | II | |
| කුරුණෑගල | ගල්ගමුව | 1070 | තේක්ක | ✓ | | 17.80 |
| | ගල්ගමුව | 1108 | තේක්ක | ✓ | | 11.142 |
| | ගල්ගමුව | 1091 | තේක්ක | ✓ | | 06.244 |
| අනුරාධපුරය | අනුරාධපුරය | 2002/01 | තේක්ක | | ✓ | 40.00 |
| | අනුරාධපුරය | 2002/09 | තේක්ක | | ✓ | 83.00 |
| | කැකිරාව | 2002/07 | තේක්ක | | ✓ | 35.00 |
| | කැකිරාව | 2002/05 | තේක්ක | | ✓ | 4.00 |
| | අනුරාධපුරය | 2002/12 | තේක්ක | | ✓ | 4.00 |
| | අනුරාධපුරය | 17 | තේක්ක | ✓ | | 20.234 |
| | කැකිරාව | 371 | තේක්ක | ✓ | | 15.00 |
| | කැකිරාව | 177 | තේක්ක | ✓ | | 4.00 |
| | කැකිරාව | 0234 | තේක්ක | ✓ | | 14.77 |
| | අනුරාධපුරය | 201 | තේක්ක | ✓ | | 10.20 |
| | අනුරාධපුරය | 230 | තේක්ක | ✓ | | 4.02 |
| | අනුරාධපුරය | 168 | තේක්ක | ✓ | | 6.020 |
| පොළොන්නරුව | හබරණ | 2002/26 | මිශ්‍ර විශේෂ | | ✓ | 47.00 |

| දිස්ත්‍රික්කය | අඩවිය | ගිවිසුම් අංකය | විශේෂය | අදියර | | ප්‍රමාණය (හෙක්.) |
|---|---|---|---|---|---|---|
| | | | | I | II | |
| මාතලේ | නාඋල | 1180 | තේක්ක | ✓ | | 9.50 |
| | නාඋල | 1228 | තේක්ක | ✓ | | 4.00 |
| | නාඋල | 1649 | තේක්ක | ✓ | | 10.00 |
| | නාඋල | 2002/15 | තේක්ක | | ✓ | 3.00 |
| | නාඋල | 2002/20 | තේක්ක / කායා | | ✓ | 90.00 |
| | නාඋල | 2002/18 | තේක්ක | | ✓ | 5.00 |
| | නාඋල | 2002/16 | තේක්ක | | ✓ | 4.00 |
| පුත්තලම | ආනමඩුව | 818 | තේක්ක | ✓ | | 4.00 |
| **එකතුව** | | | | 14 | **10** | **451.93** |

### 2.5.14 සංචාරක බංගලා වලින් ලද ආදායම - 2012

සංචාරක බංගලා, සංරක්ෂණ මධ්‍යස්ථාන, නැරඹුම් කුටි සහ කඳවුරු බිම් මහජනතාවට කුලියට දීමෙන් රුපියල් 7108536.80 ක මුදලක් උපයා ගන්නා ලදී. මේ පිළිබඳ වැඩිදුර තොරතුරු වගුව 2.22 හි දක්වා තිබේ.

**වගුව : 2.22 සංචාරක බංගලා වලින් ලද ආදායම - 2012**

| සංචාරක බංගලාවේ නම | ආදායම (රුපියල්) |
|---|---|
| අනුරාධපුරය | 109536.00 |
| ඩීන්ස්ටන් කදවුරු බිම | 149408.00 |
| ඩීන්ස්ටන් සංරක්ෂණ මධ්‍යස්ථානය | 151491.00 |
| එරබැද්ද | 11816.00 |
| ගිංගඟ | 150480.00 |
| හාලි ඇල | 37072.00 |

| සංචාරක බංගලාවේ නම | ආදායම (රුපියල්) |
|---|---|
| හම්බන්තොට | 6104.00 |
| හපුතලේ | 51576.00 |
| හිරිකටුඔය | 295859.00 |
| ඉළුක්කුඹුර සංරක්ෂණ මධ්‍යස්ථානය | 2240.00 |
| ඉළුක්කුඹුර දුම්බර වන නිවහන | 743960.00 |
| කන්දෙඇල | 574000.00 |
| උඩවත්තකැලේ | 42786.00 |
| කන්නෙලිය | 1455199.00 |
| කන්නෙලිය විධායක බංගලාව | 5600.00 |
| කතරගම | 121968.00 |
| කෙටේතැන්න | 3019.00 |
| කුඹල්පොල | 23859.00 |
| මින්නේරිය | 47040.00 |
| මින්නේරිය (නව) | 25928.00 |
| මුරකැලේ වත්ත | 165088.00 |
| නාදුගල | 7056.00 |
| නුවරඑළිය | 159264.00 |
| ඔහිය | 60648.00 |
| පට්ටිපොල | 168616.00 |
| රඹුක්ඔලුව | 137536.00 |
| සිංහරාජ ( මෝනිංසයිඩ්) | 183040.00 |
| සිංහරාජ සංරක්ෂණ මධ්‍යස්ථානය (කුඩව) | 358512.00 |

| සංචාරක බංගලාවේ නම | ආදායම (රුපියල්) |
|---|---|
| සිංහරාජ සංරක්ෂණ මධ්‍යස්ථානය (කුඩව) නැරඹුම් කුටි | 541306.80 |
| සිංහරාජ සංරක්ෂණ මධ්‍යස්ථානය (පිටදෙනිය) | 732797.00 |
| සිංහරාජ විධායක බංගලාව | 13300.00 |
| තෙල්ගමුඔය | 493472.00 |
| තබ්බෝව | 26936.00 |
| තණමල්විල | 38584.00 |
| වටවල කදවුරු බිම | 8960.00 |
| වැකුණගොඩ | 4480.00 |
| **එකතුව** | **7108536.80** |

### 2.5.15 මූල්‍යමය ප්‍රගතිය - 2012

අදාල වර්ෂය තුලදී සියළුම වන සංගණන සහ කළමනාකරණ කටයුතු සඳහා රුපියල් මිලියන 235235000.00 ක මුදලක් ලැබී තිබූ අතර ඉන් රුපියල් මිලියන 235113257.64 ක මුදලක් වියදම් කර තිබේ. මේ පිළිබඳව වැඩිදුර තොරතුරු වගුව 2.23 මගින් දැක්වේ.

**වගුව 2. 23 වන සංගණන සහ කළමනාකරණ අංශයේ මූල්‍යමය ප්‍රගතිය - 2012**

| ක්‍රියාකාරකම | ප්‍රතිපාදන (රු.) | වියදම (රු) | % |
|---|---|---|---|
| පරිහානියට පත්වූ වන වගා පුනරුත්ථාපනය කිරීම. | 800,000.00 | 799,975.00 | 100 |
| සුපෝෂණ වන වගා නඩත්තු කිරීම. | 1000,000.00 | 1,000,000.00 | 100 |
| ස්වාරක්ෂක කලාප වන වගා නඩත්තු කිරීම. | 1000,000.00 | 1,000,000.00 | 100 |
| පැරණි වන වගා කළමනාකරණය කිරීම (වන විද්‍යාත්මක ප්‍රතිකර්ම) | 24500000.00 | 24,499,808.54 | 100 |
| පුනර්ජනන හෙළීම් සිදු කල ප්‍රදේශ වල නැවත වන වගා කිරීම. | 62,000,000.00 | 61,998,474.37 | 100 |
| මිණුම් කිරීම සහ ස්කන්ධභාග ගණනය කිරීම. | 3,200,000.00 | 3,183,002.56 | 99.47 |

| ක්‍රියාකාරකම | ප්‍රතිපාදන (රු.) | වියදම (රු) | % |
|---|---|---|---|
| බීජ සහ පොලිතීන් සඳහා වියදම. | 4500000.00 | 4,400,768.11 | 97.79 |
| නොමේරූ වන වගා නඩත්තු කිරීම. | 98235000.00 | 98,232,370.72 | 100 |
| වනාන්තර වල මායිම් නඩත්තු කිරීම. | 15000000.00 | 14,998,886.48 | 100 |
| වන වගා වල මාර්ග නඩත්තු කිරීම. | 2,000,000.00 | 1,999,980.00 | 100 |
| මධ්‍යම කඳුකරයේ කඳු මුදුන් සංරක්ෂණය කිරීම. | 23,000,000.00 | 22,999,991.86 | 100 |
| **එකතුව** | **235,235,000.00** | **235,113,257.64** | **99.95** |

### 2.5.16 වන වගා වලින් ලද අස්වැන්න

මෙම වසර තුලදී සිදුකල විවිධ දැව හෙලීම් සහ වන විද්‍යාත්මක ප්‍රතිකර්ම මගින් ලබාගත් දැව ප්‍රමාණය සාරාංශයක් ලෙස වගුව 2.24 මගින් දැක්වේ. මෙම ක්‍රියාකාරකම් වලට පූර්ව වාණිජමය තුනී කිරීම්, වාණිජමය තුනී කිරීම්, පුනර්ජනන හෙලීම් සහ වරණීය හෙලීම් ඇතුලත් වේ. ආරක්ෂක හේතූන් මත රටේ උතුරු - නැගෙනහිර ප්‍රදේශ වල ඇතැම් වනාන්තර හෙළි කිරීමේදී ලද දැව සහ කුඩා පරිමාණයේ සංවර්ධන ව්‍යාපෘති සඳහා වනාන්තර හෙළිකිරීමෙන් ලද දැව ද මෙයට ඇතුලත් වේ.

වගුව 2.24 වන සම්පත් වලින් ලද ආදායම - 2012

| දැව වර්ගය | තුනී කිරීම් වලින් ලද අස්වැන්න $m^3$ | පුනර්ජනන හෙලීම් මගින් ලද අස්වැන්න $m^3$ | සම්පූර්ණ අස්වැන්න $m^3$ | වෙළඳපොල වටිනාකම (රුපියල්) |
|---|---|---|---|---|
| තේක්ක කඳන් ($m^3$) | 17 | 32,063 | 32,080 | 1,019,236,414.00 |
| නැදුන් කඳන් ($m^3$) | 9 | - | 9 | 187,854.00 |
| මැහෝගනී කඳන් ($m^3$) | 85 | - | 85 | 2,629,464.00 |
| මිල්ල කඳන් ($m^3$) | 196 | - | 196 | 2,680,931.00 |
| විශේෂ කඳන් ($m^3$) | 363 | 2 | 365 | 51,738,497.00 |

| දැව වර්ගය | තුනී කිරීම් වලින් ලද අස්වැන්න $m^3$ | පුනර්ජනන හෙලීම් මගින් ලද අස්වැන්න $m^3$ | සම්පූර්ණ අස්වැන්න $m^3$ | වෙළඳපොල වටිනාකම (රුපියල්) |
|---|---|---|---|---|
| I වන පන්තියේ දැව කඳන් ($m^3$) | - | - | - | - |
| II වන පන්තියේ දැව කඳන් ($m^3$) | 2,304 | 8,901 | 11,205 | 111,456,281.00 |
| III වන පන්තියේ දැව කඳන් ($m^3$) | 5785 | - | 5785 | 18,568,906.00 |
| පයිනස් කඳන් ($m^3$) | 226 | 29,407 | 29,633 | 301,803,181.00 |
| සිල්පර කොටන් (සංඛ්‍යාව) | 11,504 | 55,558 | 67,062 | 90,533,700.00 |
| විදුලි කණු (සංඛ්‍යාව) | 23,071 | 3,757 | 26,828 | 51,429,276.00 |
| දර **($m^3$)** | 9,510 | 58,718 | 68,228 | 13,645,600.00 |
| වැට කණු (සංඛ්‍යාව) | 29,236 | 46,071 | 75,307 | 5,648,025.00 |
| රවුම් කණු (සංඛ්‍යාව) | 71,686 | 63,776 | 135,462 | 6,773,100.00 |
| පිට පළු (සංඛ්‍යාව) | 7,977 | 90,001 | 97,978 | 9,797,800.00 |
| **එකතුව** | **161299** | **356189** | **517488** | **1,686,129,029.00** |

# 03 වන පරිච්ඡේදය
# පරිසර කළමනාකරණ අංශය

## 3.1 හැඳින්වීම

පරිසර ආරක්ෂණය තහවුරු කිරීම සහ ප්‍රතිපත්ති සකස් කිරීම, සැළසුම් සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම/ කළමනාකරණය සහ අධීක්ෂණය ඇතුළු වන විද්‍යා ක්ෂේත්‍රයේ සියළුම සංරක්ෂණ ක්‍රියා පිළිවෙත්හිදී, පරිසර ආරක්ෂණය පිළිබඳව ප්‍රමාණවත් අන්දමට කටයුතු කිරීම පරිසර කළමනාකරණ අංශයේ මූලික අරමුණ වේ. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ වන කළමනාකරණ කටයුතුවල සියළු පාරිසරික කළමනාකරණ ගැටළු හා සම්බන්ධ සැළසුම් සැකසීම, ක්‍රියාත්මක කිරීම සහ අධීක්ෂණය සඳහා ප්‍රධාන වශයෙන් වග කියනු ලබන්නේ මෙම අංශයයි.

## 3.2 ප්‍රධාන ක්‍රියාකාරකම්

- වන සම්පත් කළමනාකරණය සහ පාරිසරික මාර්ගෝපදේශ සකස් කිරීම සඳහා යථාර්ථවාදී පාරිසරික ආරක්ෂණ ක්‍රම නීර්ණය කිරීම.

- වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ තිබෙන ඉඩම් තුල සිදු කරන සියළුම වන විද්‍යාව හා සම්බන්ධ සහ සම්බන්ධ නොවන සියළුම සංවර්ධන කටයුතු පිළිබඳව පාරිසරික බලපෑම් අගැයීම් කටයුතු සිදු කිරීමෙහිලා මූලිකත්වය ගෙන ක්‍රියා කිරීම.

- පාරිසරික තිරසාර බව සුරැකීමේ අරමුණින් අනෙකුත් ව්‍යාපෘති අනුමත කිරීමේ නියෝජිත ආයතන වල තාක්ෂණික ඇගයීම් කමිටුවේ සාමාජිකයකු ලෙස වන විද්‍යා කලමනාකරණ අංශයට උපදේශන සේවාවන් සැපයීම.

- සංරක්ෂණ අරමුණු සඳහා කළමනාකරණය කළ යුතු ස්වාභාවික වනාන්තර සඳහා කළමනාකරණ සැළසුම් සකස් කිරීම සහ අනෙකුත් සියළුම වන කළමනාකරණ සැළසුම් සකස් කිරීමේදී සහ ක්‍රියාත්මක කිරීමේදී මතුවන ජෛව විද්‍යාත්මක, ජල විද්‍යාත්මක, පාංශු සංරක්ෂණය සහ අනෙකුත් පාරිසරික ගැටළු සඳහා තාක්ෂණික උපදෙස් සැපයීම.

- විශේෂයෙන්ම ජෛව විවිධත්වය සංරක්ෂණය කිරීම අරමුණු කර ගනිමින් සංරක්ෂණ කළමනාකරණ සැළසුම් ක්‍රියාත්මක කිරීම.

- ඵලදායි වන විද්‍යාත්මක පර්යේෂණ වලට සහ වන කළමනාකරණයට අදාල සංරක්ෂණ වටිනාකම ඉවහල් වන පරිඝනක ගත කරන ලද පාරිසරික තොරතුරු කළමනාකරණ පද්ධතිය (EIMS) කළමනාකරණය.

- රටේ කඩොලාන පරිසර පද්ධති ඵලදායි සංරක්ෂණ කළමනාකරණය ප්‍රවර්ධනය කිරීම.

- පුහුණු හා අධ්‍යාපනික වැඩ සටහන් තුලින් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයේ පරිසර කළමනාකරණ ගැටළු පිළිබද හැකියාව වැඩි දියුණු කිරීම.

- වනාන්තරවලට පැමිණෙන සංචාරකයින් ගෙන් සහ ඒවායේ රූගත කිරීම් සඳහා ආදායම් එකතු කිරිම.

- පාරිසරික සංචාරක කර්මාන්තය සදහා ඇති විභවය වැඩි දියුණු කිරීම සඳහා, විනෝදාත්මක පහසුකම් සැපයිය හැකි වනාන්තර වල, එම අවශ්‍ය පහසුකම් වැඩි දියුණු කිරීම.

- වන සංරක්ෂණය තහවුරු කිරීම සඳහා අවශ්‍ය කරන රජයේ නොවන ඉඩම් සහ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ ඉඩම් අත්පත් කර ගැනීම.

- අනවසරයෙන් අල්ලාගෙන සංවර්ධනය කර ඇති පැරණි ඉඩම් නිදහස් කිරීම.

## 3.3 ආයතනික සැකැස්ම

ප්‍රධාන කාර්යාලයේ පරිසර කළමනාකරණ අංශය, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය වන සංරක්ෂකවරයකු යටතේ ක්‍රියාත්මක වේ. මෙම අංශයේ ප්‍රධාන කාර්ය භාරය මෙහෙයවීමට ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය වන සංරක්ෂකවරයාට සහකාර වන සංරක්ෂකවරයකුගේ සහාය ලැබේ. මෙම අංශයෙන් පාරිසරික තොරතුරු කළමනාකරණ පද්ධතිය කළමනාකරණය, පාරිසරික බලපෑම් අගැයීම් අධ්‍යයනයන් පුනරීක්ෂණය සහ ඒ සම්බන්ධ කටයුතු කිරීම, කඩොලාන පරිසර පද්ධති ඇතුළු දෙපාර්තමේන්තුවේ සංරක්ෂණ ප්‍රදේශ කළමනාකරණයට සම්බන්ධ අනෙකුත් වැඩ සටහන් මෙහෙයවීම සහ සමාලෝචනය ඇතුලත් වේ. ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය වන සංරක්ෂක සහ සහකාර වන සංරක්ෂකගේ සහායට සංවර්ධන සහකාරවරු දෙදෙනෙකු , එක් වැඩසටහන් සහකාරවරයකු, එක් තොරතුරු තාක්ෂණ සහකාරවරයකු, කළමනාකරණ සහකරුවන් දෙදෙනෙකු සහ එක් වන ක්ෂේත්‍ර සහකාරවරයකු මෙම අංශයට අනුයුක්ත කර ඇත.

සිංහරාජ ජාතික උරුම වන භූමි ප්‍රදේශයේද, (රත්නපුරය සහ ගාල්ල දිස්ත්‍රික්කවල) නකල්ස් ප්‍රදේශයේද (මාතලේ සහ මහනුවර දිස්ත්‍රික්කවල) අනෙකුත් සංරක්ෂණ වනාන්තරවලද සංරක්ෂණ කළමනාකරණ සැලසුම්හි තෝරාගත් සංරචක ක්‍රියාත්මක කිරීම ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය වන සංරක්ෂකගේ (පරිසර කළමනාකරණ) මග පෙන්වීම යටතේ අදාල දිසා වන නිලධාරීන් සහ කලාප නියෝජ්‍ය වන සංරක්ෂකවරුන් විසින් සිදු කරන ලදී.

ගාල්ල, මාතර. හම්බන්තොට, කළුතර, ගම්පහ සහ පුත්තලම යන දිස්ත්‍රික්කවල තෝරාගත් කඩොලාන ප්‍රදේශවල කළමනාකරණ කටයුතු වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලය විසින් ඉටු කරන ලදී.

## 3.4. ක්‍රියාකාරකම්

සිංහරාජ, නකල්ස් සහ වයඹ පළාතේ තෝරාගත් කඩොලාන භූමි සදහා පිළියෙල කල කළමනාකරණ සැලැස්මවල දක්වා ඇති තෝරාගත් ක්‍රියා කාරකම් ක්‍රියාත්මක කරන ලදී. මෙයට අමතරව, මිනිසා හා ජෛවගෝල රක්ෂිත වන උඩවත්තකැලේ (මහනුවර), කුරුළුකැලේ (කෑගල්ල). කන්කානියමුල්ල, බඩගමුව සහ සුන්දරාපොළ (කුරුණෑගල) යගිරල, හේකොක් සහ රණවරාගල කන්ද (කළුතර) සහ කොරකහවැව (අනුරාධපුර) වැනි රක්ෂිත නඩත්තු කිරීම මගින් පර්යේෂණ, අධ්‍යාපන සහ විනෝදාශ්වාද කටයුතු සදහා පහසුකම් සැලසීමට කටයුතු කරන ලදී. එමෙන්ම තෝරාගත් සංරක්ෂණ මධ්‍යස්ථාන සහ කදවුරු බිම් නඩත්තු කිරීමද සිදු කරන ලදී.

### 3.4.1 සංරක්ෂණ මධ්‍යස්ථාන සහ මිනිසා සහ ජෛවගෝල රක්ෂිත නඩත්තු කිරීම

(i) සිංහරාජ, නකල්ස්, උඩවත්තකැලේ, ඔලියගන්කැලේ, කුරුළුකැලේ සහ කන්නෙලිය, රක්ෂිත වනාන්තර නඩත්තු කරන ලදී. නඩත්තු කටයුතුවලට ස්වාභාවික මංපෙත් විවෘත කිරීම සහ ඒවා නඩත්තු කිරීම, වැටවල් සකස් කිරීම , යටි වගාව, නාමපුවරු, ඉදිකිරීම සහ ඉහත ඉදි කිරීම් නඩත්තු කිරීම ඇතුලත් වේ. ඩීන්ස්ටන්, ඉලුක්කුඹුර, කන්නෙලිය සහ පිටදෙනිය සංරක්ෂණ මධ්‍යස්ථාන ද නඩත්තු කරන ලදී.

(ii) සිසුන්, ප්‍රජා සංවිධාන සහ සිංහරාජ, නකල්ස්, කන්නෙලිය සහ අනෙකුත් මිනිසා සහ ජෛවගෝල රක්ෂිත ආශ්‍රිතව වෙසෙන ගම්වැසියන් සඳහා, වන සංරක්ෂණය සහ පරිසර කළමනාකරණය පිළිබඳව දැනුවත් කිරීමේ වැඩ සටහන් සිදු කරන ලදී.

### 3.4.2. කන්නෙලිය සංරක්ෂණ මධ්‍යස්ථානයේ ක්‍රියාකාරකම්.

1. මාර්ග සහ මංපෙත් නඩත්තු කරන ලදී.
2. වැසිකිලි පද්ධති අළුත් වැඩියා කරන ලදී.
3. සංචාරක බංගලා සඳහා කොට්ට, කොට්ට උර සහ පිඟන් භාණ්ඩ කට්ටලයක් මිළදී ගන්නා ලදී.
4. කාමර අංක 04 හි සිවිලිම සැකසීම.
5. විදුලි ජනක කාමරයක් ස්ථාපනය කිරීම.

**පහත සඳහන් මංපෙත් සහ පාළම් නඩත්තු කරන ලදී.**

- අනගිමල ඇල්ල මංපෙත
- කබ්බලේ කන්ද මංපෙත
- යෝධ පුස්වැල මංපෙත
- නාරංගස් ඇල්ල මංපෙත
- නවද ගස මංපෙත
- බෝධිය මංපෙත
- කුණකටු කන්ද හරහා අනගිමල ඇල්ල මංපෙත.

### 3.4.3. හුරුළු පාරිසරික උද්‍යානයේ ක්‍රියාකාරකම්

1. හුරුළු පාරිසරික උද්‍යානයේ සියළුම ස්වාභාවික මංපෙත් නඩත්තු කරන ලදී.
2. බෝක්කු 06 ක් අළුත් වැඩියා කරන ලදී.

### 3.4.4. නකල්ස් සංරක්ෂණ මධ්‍යස්ථානයේ ක්‍රියාකාරකම්

අදාල වර්ෂය තුලදී නකල්ස් ලෝක උරුම භූමියේ නඩත්තු සහ සංරක්ෂණ කටයුතු ලෙස පහත සඳහන් ක්‍රියාකාරකම් සිදු කරන ලදී.

1. ස්වභාවික මංපෙත් නඩත්තු කරන ලදී.
2. ප්‍රවේශ මාර්ග නඩත්තු කරන ලදී. (කි.මී.42)
3. මගපෙන්වන්නන් පුහුණු කරන ලදී.

### 3.4.5. සිංහරාජ සංරක්ෂණ මධ්‍යස්ථානයේ ක්‍රියාකාරකම්

1. පිටදෙනිය දක්වා ඇති ප්‍රවේශ මාර්ගය අළුත් වැඩියා කරන ලදී.
2. ජල සැපයුම් පද්ධතිය ඉදිකරන ලදී.
3. ස්වාභාවික මංපෙත් නඩත්තු කරන ලදී.
4. නව විදුලි ජනක කාමරයක් ස්ථාපනය කරන ලදී.
5. නාම පුවරු අළුත් වැඩියා කරන ලදී.
6. කුඩා ළමයින්ට සහ තරුණයින්ට ඉංග්‍රිසි භාෂා පන්ති පවත්වන ලදී.

### 3.4.6. ඔලියගන්කැලේ ජෛව විවිධත්ව මධ්‍යස්ථානයේ ක්‍රියාකාරකම්.

1. කිලෝමීටර 05 ක ස්වාභාවික මංපෙත් නඩත්තු කරන ලදී.
2. විවේකාගාරයට සහ උද්‍යානයට විදුලිය සපයන ලදී.
3. බංකුවලට ආසන්නව ජල සැපයුම් පද්ධතිය ස්ථාපනය කරන ලදී.
4. නාම පුවරු ස්ථාපනය කරන ලදී.
5. ගොඩනැගිල්ල නැවත ඉදිකිරීම.

### 3.4.7. හපුතලේ උද්‍යානයේ ක්‍රියාකාරකම්

1. මාර්ගයේ මීටර 30 ක කොටසකට කොන්ක්‍රීට් දමන ලදී.
2. කිලෝ මීටර 3.0 ක ස්වාභාවික මංපෙත් ප්‍රමාණයක් නඩත්තු කරන ලදී.
3. එළිමහන් කූඩාරම් සහ බංකු 12 ක් නඩත්තු කරන ලදී.
4. වැව අළුත්වැඩියා කරන ලදී.

### 3.4.8. සංචාරකයින්ගේ තොරතුරු සහ ඔවුන්ගෙන් ප්‍රවේශ ගාස්තු ලෙස එකතු කල ආදායම.

සංචාරකයින්ගේ තොරතුරු සහ ප්‍රවේශ පත්‍ර නිකුත් කිරීම මගින් එක් එක් රක්ෂිත වනාන්තරයෙන් රැස්කල ආදායම වගුව 3.1 (අ) – 3.1 (උ) මගින් දැක්වේ.

**වගුව 3.1 (අ) උඩවත්ත කැලේ. ( මහනුවර)**

| **අමුත්තන් වර්ගය** | **අමුත්තන් සංඛ්‍යාව** | **ප්‍රවේශ ගාස්තු ලෙස රැස්කල ආදායම (රුපියල්)** |
|---|---|---|
| පාසැල් සිසුන් | 1401 | |
| දේශීය ළමුන් | 420 | |
| දේශීය වැඩිහිටි | 6292 | **2,600,272.64** |
| විදේශීය ළමුන් | 214 | |
| විදේශීය වැඩිහිටි | 4072 | |
| **එකතුව** | **12,399** | |

වගුව 3.1. (ආ) නකල්ස් වනාන්තරය (ඩීන්ස්ටන් , මහනුවර)

| අමුත්තන් වර්ගය | අමුත්තන් සංඛ්‍යාව | ප්‍රවේශ ගාස්තු ලෙස රැස්කල ආදායම (රුපියල්) |
|---|---|---|
| පාසල් සිසුන් | 35 | |
| දේශීය වැඩිහිටි | 1464 | |
| දේශීය ළමුන් | 100 | 359,480.80 |
| විදේශීය ළමුන් | - | |
| විදේශීය වැඩිහිටි | 491 | |
| **එකතුව** | **2090** | |

වගුව 3.1. (ඇ) නකල්ස් වනාන්තරය (පිටවලපතන , මාතලේ )

| අමුත්තන් වර්ගය | අමුත්තන් සංඛ්‍යාව | ප්‍රවේශ ගාස්තු ලෙස රැස්කල ආදායම (රුපියල්) |
|---|---|---|
| පාසල් සිසුන් | 2730 | |
| දේශීය වැඩිහිටි | 18106 | |
| දේශීය ළමුන් | 424 | 591,256.04 |
| විදේශීය ළමුන් | 17 | |
| විදේශීය වැඩිහිටි | 160 | |
| **එකතුව** | **21437** | |

වගුව 3.1. (ඈ) සිංහරාජ වනාන්තරය ( පිටදෙනිය, මාතර )

| අමුත්තන් වර්ගය | අමුත්තන් සංඛ්‍යාව | ප්‍රවේශ ගාස්තු ලෙස රැස්කල ආදායම (රුපියල්) |
|---|---|---|
| පාසල් සිසුන් | 0 | |
| දේශීය ළමුන් | 227 | |
| දේශීය වැඩිහිටි | 3586 | 1,903,487.50 |
| විදේශීය ළමුන් | 124 | |
| විදේශීය වැඩිහිටි | 3560 | |
| **එකතුව** | **7,497** | |

වගුව 3.1. (ඉ) සිංහරාජ වනාන්තරය ( කුඩව, රත්නපුර )

| අමුත්තන් වර්ගය | අමුත්තන් සංඛ්‍යාව | ප්‍රවේශ ගාස්තු ලෙස රැස්කල ආදායම (රුපියල්) |
|---|---|---|
| පාසල් සිසුන් | 8924 | |
| දේශීය ළමුන් | 1766 | |
| දේශීය වැඩිහිටි | 14864 | **4,681,626.88** |
| විදේශීය ළමුන් | 176 | |
| විදේශීය වැඩිහිටි | 6572 | |
| **එකතුව** | **32302** | |

වගුව 3.1. (ඊ) හුරුළු පාරිසරික උද්‍යානය ( හබරණ , පොළොන්නරුව)

| අමුත්තන් වර්ගය | අමුත්තන් සංඛ්‍යාව | ප්‍රවේශ ගාස්තු ලෙස රැස්කල ආදායම (රුපියල්) |
|---|---|---|
| පාසල් සිසුන් | 713 | |
| දේශීය වැඩිහිටි | 12433 | **22,185,603.51** |
| විදේශීය ළමුන් | 472 | |
| විදේශීය වැඩිහිටි | 20563 | |
| **එකතුව** | **34181** | |

වගුව 3.1. (උ) කොට්ටව වනාන්තරය (ගාල්ල)

| අමුත්තන් වර්ගය | අමුත්තන් සංඛ්‍යාව | ප්‍රවේශ ගාස්තු ලෙස රැස්කල ආදායම (රුපියල් ) |
|---|---|---|
| පාසල් සිසුන් | 75 | |
| දේශීය ළමුන් | 17 | |
| දේශීය වැඩිහිටි | 156 | **156,285.60** |
| විදේශීය ළමුන් | 10 | |
| විදේශීය වැඩිහිටි | 214 | |
| **එකතුව** | **472** | |

**වගුව 3.1. (ඌ) කන්නෙලිය වනාන්තරය (ගාල්ල )**

| **අමුත්තන් වර්ගය** | **අමුත්තන් සංඛ්‍යාව** | **ප්‍රවේශ ගාස්තු ලෙස රැස්කල ආදායම (රුපියල් )** |
|---|---|---|
| පාසල් සිසුන් | 4837 | |
| දේශීය ළමුන් | 2019 | |
| දේශීය වැඩිහිටි | 16677 | **1,205,467.76** |
| විදේශීය ළමුන් | 38 | |
| විදේශීය වැඩිහිටි | 1062 | |
| **එකතුව** | **24,633** | |

සම්පූර්ණ ආදායම රුපියල් 33,683,480.73 කි.

### 3.4.9. වනාන්තර තුල රූගත කිරීම් වලින් ලද ආදායම.

දෙපාර්තමේන්තුව මගින් කළමනාකරණය කරනු ලබන රක්ෂිත වනාන්තර තුල වීඩියෝ රූගත කිරීම් වලින් රුපියල් 291,760.00 ක ආදායමක් ලැබී තිබේ.

### 3.4.10 පාරිසරික බලපෑම් අගැයීම

රජයේ වනාන්තර ඉඩම්වල ක්‍රියාත්මක කරනු ලබන වන විද්‍යාත්මක සහ වන විද්‍යාත්මක නොවන සංවර්ධන ව්‍යාපෘතිවල පාරිසරික බලපෑම් අගැයීම සඳහා 2004 වසරේදී වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව ව්‍යාපෘති අනුමත කිරීමේ ආයතනයක් ලෙස පත් කරන ලදී. ඒ අනුව 2007, 2008, 2009, 2010, 2011 සහ 2012 වසර සඳහා පාරිසරික අනුමැතිය ලබා ගැනීම සඳහා ව්‍යාපෘති යෝජනා 30 ක් ඉදිරිපත් කර තිබේ. මින් යෝජනා 02 ක් අනුමත කරන ලද අතර ඒවායේ අධීක්ෂණ කටයුතු සිදු කරමින් පවතී. (වගුව 3.2) අනෙකුත් යෝජනා අනුමත කිරීම සඳහා විවිධ මට්ටම්වල අගැයීමට ලක් කරමින් පවතී.

**වගුව 3. 2**

| | **අනුමත කල ව්‍යාපෘති ලැයිස්තුව** |
|---|---|
| 01 | වතුර ටැංකිය - මහගොන, දඹුල්ල |
| 02 | සූර්ය බලශක්ති මධ්‍යස්ථානය - වවුනියාව |

අනෙකුත් අදාල ආයතන සමග ඒකාබද්ධව ව්‍යාපෘති 25 ක අගැයීම් සහ අධීක්ෂණ කටයුතුවල නිරතවන්නාවූ තාක්ෂණික අගැයිම් කමිටුවේ නියෝජිතයකු ලෙස කටයුතු කරයි.

### 3.4.11. පාරිසරික තොරතුරු කළමනාකරණ පද්ධතිය

ස්වාභාවික වනාන්තර 660 කට අදාල දත්ත අඩංගු EIMS මූලාශ්‍රය නඩත්තු කරන ලද අතර, සිසුන්, පර්යේෂකයින් සහ විවිධ පුද්ගලික සහ රාජ්‍ය අංශවල පුද්ගලයින් යන සියල්ලන්ටම අවශ්‍ය තොරතුරු සපයන ලදී.

### 3.4.12. ඉඩම් නීත්‍යානුකූල කිරීම

අනවසරයෙන් අල්ලාගෙන සංවර්ධනය කරන ලද, වන සංරක්ෂණ දෙපාර්තමේන්තු පාලනය යටතේ පවත්නා ඉඩම් හෙක්ටයාර් 1009.5 ක්, එම අනවසර පදිංචිකරුවන් වෙත නීත්‍යානුකූලව පැවරීම සඳහා වන සංරක්ෂක ජනරාල්ගේ අනුමැතිය ඇතිව ඉඩම් කොමසාරිස් ජනරාල් වෙත නිදහස් කරන ලදී. වන සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය යටතේ වනාන්තරවල මායිම් නැවත සලකුණු කිරීමෙන් පසු මෙම කටයුත්ත සිදු කරන ලදී.

වන සංරක්ෂක ජනරාල්ගේ අනුමැතිය ඇතිව යම් භූමි ප්‍රමාණයක් ප්‍රාදේශීය ලේකම්වරුන්ට සහ අනෙකුත් අදාල බලධාරීන් වෙත නිදහස් කරන ලදී. ඒ අනුව උමා ඔය සංවර්ධන ව්‍යාපෘතිය සහ වව්නියා පේරු ආරු ව්‍යාපෘතිය ඇතුළු විවිධ ඉඩම් සංවර්ධන වැඩ සටහන් සදහා ඉඩම් හෙක්ටයාර 93.5 ක් විවිධ ආයතනවලට නිදහස් කරන ලදී.

උතුරු ප්‍රදේශයේ සිටින අවතැන්වූ ජනයා නැවත පදිංචි කිරීම සඳහා වන සංරක්ෂක ජනරාල්ගේ අනුමැතිය ඇතිව ප්‍රාදේශීය ලේකම්වරුන්ට සහ අනෙකුත් අදාල ආයතන වලට හෙක්ටයාර 80.9 ක් නිදහස් කරන ලදී.

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව යටතේ පවත්නා හෙක්ටයාර 6.2 ක් ආරක්ෂක අමාත්‍යාංශයේ ජාතික ආරක්ෂණ කටයුතු සදහා ඉඩම් කොමසාරිස් ජනරාල් වෙත නිදහස් කරන ලදි. එමෙන්ම තවත් හෙක්ටයාර 15.3 ක භූමි ප්‍රමාණයක් අනෙකුත් සංවර්ධන ව්‍යාපෘති සඳහා නිදහස් කරන ලදී.

කෘෂි වන වගා කටයුතු සදහා ගිවිසුම් අත්සන් කර තිබෙන හෙක්ටයාර 122.3545 ක භූමි ප්‍රමාණයක ගිවිසුම, අදාල වර්ෂය තුලදී දීර්ඝ කරන ලදී.

### 3.4.13. ඉඩම් අත්පත් කර ගැනීම

#### 3.4.13.1. සිංහරාජ ලෝක උරුම භූමිය

සිංහරාජ ලෝක උරුම භූමියේ සංරක්ෂණ කටයුතු සදහා වූ 2004 වසරේ අංක 04/0858/001/005-111 දරණ අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව යටතේ වනාන්තර ඉඩම් අත්පත් කර ගැනීමට අදාල කටයුතු මෙම අංශය විසින් සිදු කරන ලදි. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසන් සභාවට අයත් ගාල්ල, මාතර සහ රත්නපුර යන දිස්ත්‍රික්ක ආවරණය කරන්නා වූ ඉඩම් හෙක්ටයාර 3999 ක් අත්පත් කරගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. 2012 වසර තුලදී ඉඩම් හෙක්ටයාර 49.9 ක භුක්තිය ලබා ගැනීමට හැකිවිය. තවද, සිංහරාජ රක්ෂිත වනාන්තරයේ ආරක්ෂාව

තහවුරු කිරීම සඳහා මායිම් පුළුල් කිරීම උදෙසා පුද්ගලික ඉඩම් හෙක්ටයාර 400 ක් පමණ හඳුනාගෙන තිබෙන අතර, මෙම ඉඩම් අත්පත් කර ගැනීම සඳහා කටයුතු කරමින් පවතී.

### 3.4.13. 2 නකල්ස් සංරක්ෂණ වනාන්තරය

නකල්ස් සංරක්ෂණ වනාන්තරය තුල පිහිටා තිබෙන ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු 1990 දී ආරම්භ කරන ලදී. මහනුවර සහ මාතලේ දිස්ත්‍රික්ක තුල පිහිටි විවිධ පාර්ශ්වයන්ට අයත් පුද්ගලික ඉඩම් හෙක්ටයාර 3569.643 ක ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය සිදුකෙරෙමින් පවතී. ඉඩම් පිළිබඳ වගකීම දරනු ලබන අමාත්‍යාංශයේ උපදෙස්මත අදාළ ප්‍රාදේශීය ලේකම්වරුන් ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු ක්‍රියාත්මක කරන ලදී. වැඩිදුර තොරතුර වගුව 3.3 මගින් දැක්වේ.

**වගුව 3.3 නකල්ස් සංරක්ෂණ වනාන්තරය සඳහා ඉඩම් අත්පත්කර ගැනීම.**

| විස්තරය | මහනුවර දිස්ත්‍රික්කය (හෙක්ටයාර) | මාතලේ දිස්ත්‍රික්කය (හෙක්ටයාර) |
|---|---|---|
| 2011 වසර අවසන් වන විට අත්පත් කර ගැනීමට යෝජිත ඉඩම් ප්‍රමාණය | 2044.783 | 1490.490 |
| මෙම වසර තුල අත්පත් කර ගැනීමේ කටයුතු ආරම්භ වු නව ඉඩම් ප්‍රමාණය | 20.00 | 14.37 |
| වසර 2012 අවසානය වන විට අත්පත් කර ගැනීමට යෝජිත මුළු භූමි ප්‍රමාණය | 2064.783 | 1504.86 |
| 2012 වසර අවසන්වන විට අත්පත් කරගත් මුළු භූමි ප්‍රමාණය | 292.7735 | 139.574 |

## 04 වන පරිච්ඡේදය
## පර්යේෂණ සහ අධ්‍යාපන අංශය

### 4. 1. හැඳින්වීම

ශ්‍රී ලංකාවේ විධිමත්, වන විද්‍යාත්මක පර්යේෂණ කටයුතුවල ආරම්භය සනිටුහන් කරමින්, 1937 වර්ෂයේදී වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ පර්යේෂණ සහ අධ්‍යාපන අංශය, වන විද්‍යාත්මක පර්යේෂණ ඒකකය ලෙස ආරම්භ කරන ලදී. මෙම අංශයට දෙපාර්තමේන්තු බල සීමාව තුල, වන විද්‍යාත්මක පර්යේෂණ කටයුතු පරිපාලනය සහ වන විද්‍යා ක්ෂේත්‍රය හා සම්බන්ධ අධ්‍යාපන කටයුතු ක්‍රියාත්මක කිරීම යන කටයුතුවල වගකීම පැවරී තිබේ.

මෙම අංශය, කුරුණෑගල සහ බදුල්ල යන ස්ථානවල පිහිටි ප්‍රාදේශීය පර්යේෂණ මධ්‍යස්ථාන, ශ්‍රී ලංකා වන විද්‍යායතනය සහ වන විද්‍යා තොරතුරු ඒකකය යන අංශ වලින් සමන්විත වේ. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ පුස්තකාලයද මෙම අංශය යටතේ පවතී. මෙයට අමතරව, වනාන්තර පරිසර පද්ධති හා සම්බන්ධ පර්යේෂණ යෝජනා සමාලෝචනය කරන හා ඒ සඳහා අනුමැතිය ලබා දෙන මූලික ආයතනය වන ජාතික වන විද්‍යා ක්ෂේත්‍රයේ පර්යේෂණ කමිටුවේ රැස්වීම් සම්බන්ධීකරණය කිරීමද මෙම අංශය සතු වගකීමකි.

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ වාර්ෂික පර්යේෂණ වැඩ සටහන්, පර්යේෂණ මධ්‍යස්ථාන හරහා ක්‍රියාත්මක කරනු ලබන අතර, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ, රාජ්‍ය දැව සංස්ථාවේ සහ වන වගා කටයුතු වල නිරතව සිටින පුද්ගලික අංශයේ ගැටළු නිරාකරණය කිරීමේ ලා ඍජුව ක්‍රියා කරයි. මෙම මධ්‍යස්ථාන විසින්, සංරක්ෂණ සහ නිෂ්පාදන වන විද්‍යාව සම්බන්ධව ව්‍යවහාරික සහ අනුවර්තීය පර්යේෂණ කටයුතු සිදු කරයි.

දෙපාර්තමේන්තුවේ තාක්ෂණික සේවයේ කාර්ය මණ්ඩලයේ හැකියාවන් ශක්තිමත් කිරීම සඳහා, ප්‍රධාන වශයෙන්ම වන විද්‍යාව සහ පරිසරය ආශ්‍රිත විෂයන් මත පුහුණු වැඩ සටහන්, නුවරඑළියේ පිහිටා තිබෙන ශ්‍රී ලංකා වන විද්‍යායතනය මගින් සිදු කරනු ලබයි.

වන විද්‍යා තොරතුරු ඒකකය මගින්, වන විද්‍යාව හා සම්බන්ධ පර්යේෂණ වල ප්‍රතිඵල, ඒවා අපේක්ෂාවෙන් සිටින ප්‍රතිලාභ ලබන්නන් වෙත වඩාත් සාර්ථක අන්දමට ලබා දීමේ අරමුණින් ක්‍රියා කරයි. මේ වන විට පුස්තකාලය සතුව ග්‍රන්ථ 7075 ක් පමණද, වාර්තා 360 ක් පමණද, සඟරා 73 ක් පමණද තිබේ. තවද *TREECD* සහ වන විද්‍යා සංක්ෂේපය නමින් හඳුන්වන ජාත්‍යන්තරව පිළිගත් වන විද්‍යා ප්‍රභවයන් දෙක (02) ද වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ පුස්තකාලය සතුව තිබේ. මෙම දත්ත ගබඩා මගින් වන විද්‍යාව හා සම්බන්ධ සෑම තොරතුරක්ම තනි සංයුක්ත තැටියකින් ලබා ගත හැක.

## 4.2. පර්යේෂණ

### 4.2.1. නව පර්යේෂණ කටයුතු

#### 4.2.1.1. වන විද්‍යාත්මක සහ ශාක වැඩි දියුණු කිරීම සම්බන්ධ පර්යේෂණ වැඩ සටහන්

#### 4.2.1.1.1 තේක්ක වැඩි දියුණු කිරීමේ වැඩ සටහන

තේක්ක වැඩි දියුණු කිරීමේ වැඩ සටහනට දීර්ඝ කාලීන බෝකිරීමේ වැඩ සටහනක් සහ කෙටි කාලීන බීජ සම්පත් සංවර්ධනය කිරීමේ වැඩ සටහනක් ඇතුලත් වේ. කෙටි කාලීන බීජ සම්පත් සංවර්ධනය කිරීමේ වැඩ සටහන යටතේ බීජ නිෂ්පාදනය කරන ප්‍රදේශ සහ ක්ලෝනීකරණය කරන ලද 1970 දී ස්ථාපනය කරන ලද පැරණි බීජ වතු නඩත්තු කිරීමට සැළසුම් සකස් කර තිබේ. දීර්ඝ කාලීන බෝකිරීමේ වැඩ සටහනට මූලික බෝකිරීමේ ගහණ ස්ථාපනය කිරීම, එහි ප්‍රතිඵලයක් ලෙස ලැබෙන ඊලග පරම්පරාවන් ස්ථාපනය කිරීම සහ ක්ලෝනීකරණය කරන ලද නව බීජ වතු සංවර්ධනය කිරීම අයත් වේ. 2012 වර්ෂයේදී, තේක්ක බෝකිරීමේ වැඩ සටහනට අදාල බිම් කොටස් (ආනපල්ලම සහ නිකවෙහෙර පිහිටි හෙක්ටයාර 10) සහ ඇත්ගල පිහිටි හෙක්ටයාර 5 ක් වු අළුතින් සංවර්ධනය කරන ලද ක්ලෝනීකරණය කරන ලද බීජ වතුවල නඩත්තු කටයුතුද සිදු කරන ලදී. දැනට තිබෙන බෝකිරීමේ වැඩ සටහන සදහා දේශීය ජානමය ද්‍රව්‍ය ලබා ගැනීමට ධන ශාක (ඉහල ගුණාත්මක බවකින් යුක්ත ශාක) තේරීමේ වැඩ කටයුතු ද ආරම්භ කරන ලදී.

#### 4.2.1.1.2. Khaya Senagalensis වැඩි දියුණු කිරීමේ වැඩ සටහන.

Khaya වැඩි දියුණු කිරීමේ වැඩ සටහන මෑතකදී ශ්‍රී ලංකාවේ ආරම්භ කරන ලදී. වැල්ලවාය සහ නිකවෙහෙර යන ස්ථාන දෙකෙහි පුළුල් පරාසයක් තුල ව්‍යාප්තව පවතින Khaya ප්‍රභේද ස්ථාපනය කර තිබෙන අතර ක්ලෝනීකරණය කරන ලද බීජ වතු ස්ථාපනය කිරීමේ කටයුතු මේ වන විට සිදු කරමින් පවතී. ඇත්ගල ප්‍රදේශයේ හෙක්ටයාර 3 ක් පුරා ව්‍යාප්තව පවතින බද්ධ කරන ලද Khaya ශාක යොදාගෙන ස්ථාපනය කරන ලද බීජ වතුවල නඩත්තු කටයුතු සම්පූර්ණ කරන ලදී. (ක්ලෝන 10 ක්)

මූලික ගහණ බෝකිරීමේ සංවර්ධන කටයුතු සදහා ධන ශාක තෝරා ගැනීම ආරම්භ කරන ලදී.

#### 4.2.1.1.3 . Eucalyptus බෝකිරීමේ වැඩ සටහන

1995 දී Eucalyptus grandis සදහා දීර්ඝ කාලීන බෝකිරීමේ වැඩ සටහනක් ආරම්භ කරන ලද අතර 2008 දී දෙවන පරම්පරාවේ කටයුතු ආරම්භ කරන ලදී. 2012 වර්ෂයේදී E . grandis වල ජානමය පර්යේෂණ කටයුතු වලට අදාල බිම් කොටස් ( 1995 දී සහ 2008 දී පරම්පරාවන් අධ්‍යයනය සදහා ස්ථාපනය කරන ලද ) නඩත්තු කරන ලදී. තවද E. Grandis බද්ධ කිරීම සහ වර්ධක ප්‍රචාරණය හා සම්බන්ධ තවාන් පරීක්ෂණ කටයුතු තවදුරටත් සිදු කෙරිණි. E . grandis සහ E . teriticornis හි වර්ධක ප්‍රචාරණය පිළිබදව සිදුකල පරීක්ෂණ වලින් රෝපණ මාධ්‍ය සහ අවශ්‍ය තෙතමනය පිලිබදව ඉතාම සාර්ථක ප්‍රතිඵල අත්කර ගැනිමට හැකිවිය. වඩාත්ම සාර්ථක ප්‍රතිකර්ම සංකලනයේදී 70% කට වැඩි ප්‍රතිශතයක් මුල් ඇදුණු බව සොයා ගන්නා ලදී. බද්ධ කිරීම ආශ්‍රිත පරීක්ෂණ වලින් එතරම් සාර්ථක ප්‍රතිඵල නොලැබුනි.

### 4.2.1.1.4. සුදු හඳුන් ස්ථාපනය කිරීමේ පරීක්ෂණ බිම් කට්ටි - කුරුණෑගල

විවිධ ධාරක ශාක සහ පොහොර මිශ්‍රණ යොදාගනිමින් වියලි කලාපයේදී සුදු හඳුන් ශාකය පෙන්නුම් කරන වර්ධනය අධ්‍යයනය කිරීම සඳහා කුරුණෑගල ,මැල්සිරිපුර සුදු හඳුන් ස්ථාපනය කිරීමේ පරීක්ෂණ කටයුතු අරඹන ලදි.

මෙහිදී සුදු හඳුන් ශාකය කරද, බුළු, කොහොඹ සහ හුලංහික් යන විශේෂ සමග N.P.K. පොහොර යොදා මෙන්ම N.P.K. + කොම්පෝස්ට් පොහොර යොදා ද පරීක්ෂා කරන ලදි.

### 4.2.1.1.5. කොට්ට පුළුන් වර්ධනය පිළිබඳ අධ්‍යයනය- කුරුණෑගල

දැව , තන්තු, ගවයන්ට සහ එළුවන්ට ආහාර සහ තවත් ප්‍රයෝජන රැසක් සඳහා යොදා ගන්නා සීඝ්‍ර වර්ධනයක් පෙන්නුම් කරන ශාක විශේෂයක් ලෙස කොට්ට පුළුන්වල වර්ධනය සහ අස්වැන්න අධ්‍යයනය කිරීම සඳහා විවිධ සම්භවයකින් යුක්ත බීජ යොදා ගනිමින් පර්යේෂණ සිදු කරන ලදි. මේ සඳහා නුවර, බදුල්ල සහ කුරුණෑගල යන දිස්ත්‍රික්කවලින් බිජ රැස් කරන ලදී.

### 4.2.1.1.6. සුදු හඳුන් ස්ථාපනය කිරීමේ බිම් කට්ටි , පුත්තලම,

පුත්තලම දිස්ත්‍රික්කය තුල සුදු හඳුන් වගා කිරීමේ සාර්ථකත්වය අධ්‍යයනය කිරීම සඳහා පුත්තලමේ ආණමඩුව ප්‍රදේශයේ සුදු හඳුන් ස්ථාපනය කිරීමේ පරීක්ෂණ බිම් කට්ටි පිහිටුවන ලදි.

### 4.2.1.1.7. තවාන් සමීක්ෂණය

බිජ පැලවල තත්වය, පලිබෝධකයින් සහ රෝග, අවශ්‍ය කරන වැඩි දියුණු කිරීම් ආදී තොරතුරු රැස් කිරීමට නිර්දේශිත ආකෘති පත්‍රයක් උපයෝගීකර ගනිමින් දෙපාර්තමේන්තුවේ පැළ තවාන් පිළිබඳ සමීක්ෂණයක් සිදු කරන ලදී.

### 4.2.1.1.8. ගෙවතු වලින් ලැබෙන දැව සැපයුම අධ්‍යයනය කිරීම

වනාන්තරවලින් බැහැර ස්ථාන වලින් ලැබෙන දැව සැපයුම පිළිබඳව අගැයීම සඳහා හම්බන්තොට දිස්ත්‍රික්කයේ වලස්මුල්ල අඩවිය තුල මුලික අධ්‍යයනයක් සිදු කරන ලදි. මෙහිදී ලබාගත් තොරතුරු උපයෝගී කර ගනිමින් සමස්ථ දිවයිනෙන්ම තොරතුරු රැස් කිරීම සඳහා අධ්‍යයනයක් සැකසීමට නියමිතය.

### 4.2.1.1.9. දෙවන වරට තේක්ක ස්ථාපනය කිරීමේදී පසේ සාරවත් බව පිළිබඳව අධ්‍යයනය කිරීම - අනුරාධපුර

අනුරාධපුර දිස්ත්‍රික්කයේ පිහිටි දෙවන වරට තේක්ක වගා කරන ස්ථාන නවයක් මෙම භූමි පන්ති තුන නියෝජනය කිරීම සඳහා යොදා ගන්නා ලදි. මෙම සෑම ස්ථානයක්ම නියෝජනය කිරීම සඳහා වර්ධන දත්ත සහ පස් සාම්පල්

එක් රැස් කරන ලදී. N, P, K, Ca, Mg, B, Cu, Zn, S, Fe, Mn යන මුල ද්‍රව්‍ය සඳහාත් PH, OM සහ CEC සඳහාත් පස් සාම්පල විශ්ලේෂණය කරන ලදී. මෙහිදී රැස්කල දත්ත විශ්ලේෂණය කිරීම මගින් වර්ධන පරාමිති සහ පසේ රසායනික ගුණාංග අතර පවතින සම්බන්ධතාව ස්ථාපනය කිරීමට අපේක්ෂිතයි.

### 4.2.1.1.10. පුත්තලමේ පිහිටි කඩොලාන පරිසර පද්ධති පුනරුත්ථාපනය කිරීම

අතීතයේදී ඉස්සන් වගාව සඳහා පොකුණු ඉදිකරන විට කඩොලාන වනාන්තර වලින් විශාල ප්‍රමාණයක් විනාශ විය. මෙලෙස ඉදිකල පොකුණුවලින් සෑහෙන සංඛ්‍යාවක් දීර්ඝමය ආසාදනයක් හේතුකොට ගෙන වර්තමානයේදී අතහැර දමා තිබේ. පුත්තලම දිස්ත්‍රික්කය තුල කඩොලාන වනාන්තර ප්‍රතිස්ථාපනය කිරීමට ඇති හැකියාව අගැයීම සඳහා අධ්‍යනයක් සිදු කරන ලදී.

### 4.2.1.1.11. වන්නි ප්‍රදේශයේ කොස් වගාවක් ස්ථාපනය කිරීම

2011 වර්ෂයේදී වවුනියා දිස්ත්‍රික්කයේ පම්පායිමඩු ප්‍රදේශයේ මෙම පර්යේෂණ බිම් කට්ටි සාර්ථකව ස්ථාපනය කරන ලදී. මේ සඳහා කොස් පැළ 1500 ක් පමණ සකස් කරන ලදී. කෙසේවුවද, 2012 වර්ෂයේදී මෙම පර්යේෂණ බිම් කට්ටි දැඩි නියගය හා මීයන් වැනි සතුන්ගේ ක්‍රියාකාරිත්වය හේතුකොටගෙන විනාශ විය. එබැවින් මෙම පර්යේෂණ බිම් කට්ටි 2012 වසරේදී සාර්ථක ලෙස නැවත ස්ථාපනය කරන ලදී.

### 4.2.1.1.12 උණ සහ බිම් කොහොඹ ක්ෂුද්‍ර ප්‍රචාරණය

මෙම වසරේදී කුඹල්පොල පර්යේෂණ මධ්‍යස්ථානය මගින් රන්වන් උණ නැමැති විශේෂය ගුණනය වන මට්ටම දක්වා සාර්ථක ලෙස රෝපනය කරන ලදී. වර්තමානයේදී බහුප්‍රජ සහ සෞඛ්‍ය සම්පන්න ක්ෂුද්‍ර ප්‍රරෝහ ලබාගැනිමට යොදාගත හැකි යෝග්‍ය ගුණන මාධ්‍යයක් සොයා ගැනිම සඳහා පරික්ෂණ සිදු කරයි. තවද Dendrocalamus asper විශේෂයද සාර්ථක ලෙස රෝපනය කිරීමට හැකියාව පවතින අතර බහුප්‍රජ සහ සෞඛ්‍ය සම්පන්න ක්ෂුද්‍ර ප්‍රරෝහ ලබා ගැනීමට යොදාගත හැකි ගැලපෙන ගුණන මාධ්‍යයක් හඳුනා ගැනිමට ද හැකියාව පවති. මෙම විශේෂවල මුල් ඇද්දවීම කෙරෙහි අළුත් පර්යේෂණ යොමු වී තිබේ.

බීජ තාක්ෂණ අංශයේ අවශ්‍යතාවය සැලකිල්ලට ගෙන අරළු, සුදු හඳුන්, සහ බුළු යන ශාක විශේෂ පරීක්ෂණාගාර තුල ප්‍රරෝහණය කිරීමේ ක්‍රමවේදයක් සාර්ථකව ස්ථාපනය කරන ලදී. ඉතා කෙටි කාලයක් තුල බීජ වල ජීව්‍යතාවය තීරණය කිරීමට උපයෝගි කර ගත හැකි හොදම ක්‍රමය, පරීක්ෂණාගාර තුල බීජ ප්‍රරෝහණය කිරිමයි. පරීක්ෂණාගාර තුල පරීක්ෂණ නළ තුල ප්‍රරෝහණය කරන ලද මෙම බීජ පැළ උපයෝගිකර ගනිමින් ක්ෂුද්‍ර ප්‍රචාරණ අධ්‍යයනයක් අරළු සහ සුදු හඳුන් සඳහා සිදුකරමින් පවති. තේක්ක සහ බිං කොහොඹ යන විශේෂ වලින් සැලකියයුතු ප්‍රගතියක් ලැබී නොමැත.

### 4.2.1.1.13. පොල්ගොල්ල ප්‍රදේශයේ තේක්කවල වර්ධක ප්‍රචාරණය හා සම්බන්ධ පර්යේෂණ තව දුරටත් සිදු කිරීම.

මෙම කටයුත්ත සඳහා මෙම ස්ථානයේ පිහිටි මව් ශාක වලින් ලබාගත් කොපිස භාවිතා කරන ලදි. සියළුම ශාක කප්පාදු කර කඩත්තු කරන ලදී. මූලික පරීක්ෂණ වලින් සාර්ථක ප්‍රතිඵල ලැබී තිබේ. මෙම පරීක්ෂණ 2013 වසරේදී ද අඛණ්ඩව සිදු කිරීම අපේක්ෂිතයි.

### 4.2.1.1.14. Clusia rosea සහ Miconia Calvescens යන ආක්‍රමණශීලි ශාක විශේෂවල චර්යාව අධ්‍යයනය - හැටන් සහ නාවලපිටිය අඩවිවල

මෙම වන අඩවි දෙක තුල සුලභව දක්නට ලැබෙන ඉහත සඳහන් ආක්‍රමණශීලී ශාක විශේෂ දෙකෙහි ජීව විද්‍යාව, වර්ධනය, වාසස්ථාන, ප්‍රයෝජන, අහිතකර බලපෑම් සහ පාලන ක්‍රම පිලිබඳව දීර්ඝ ලෙස අධ්‍යයනය කරන ලදි. මෙම ශාක විශේෂ දෙක වනාන්තර පරිසර පද්ධතියට අනාගතයේදී විශාල ලෙස අහිතකර බලපෑම් ඇති කිරීමේ හැකියාවක් පවතින බැවින් මෙම විශේෂ පාලනය කිරීම හෝ ඒවායේ බලපෑම් පහත හෙලීම කෙරෙහි වැඩි අවධානයක් යොමු කල යුතුය.

### 4.2.1.1.15. දේශීය විශේෂ ස්ථාපනය කිරීම සහ කලමනාකරණය කිරීම පිළිබද පර්යේෂණ.

මිහින්තලේ සහ වග පිහිටි දේශගුණික කලාප දෙකකට අයත් ස්ථාන දෙකක පර්යේෂණ බිම් කට්ටි දෙකක් ස්ථාපනය කරන ලදි. මෙම අධ්‍යනයේදී නැදුන් , කළුවර සහ පිහිඹියා යන ශාක විශේෂවල වර්ධනය මෙම දේශගුණික කලාප දෙකේදී වෙනස්වන ආකාරය පිළිබදව සොයා බලනු ලැබේ. මෙම පර්යේෂණයේ ප්‍රතිඵල ප්‍රයෝජනයට ගෙන දේශීය විශේෂ සඳහා යෝග්‍ය ස්ථාපනය කිරීමේ සහ කලමනාකරණය කිරීමේ පැකේජ සකස් කිරීමට අපේක්ෂිතයි.

### 4.2.1.1.16. තේක්ක කොපිස නඩත්තු කිරීමේ පර්යේෂණය - මැල්සිරිපුර

මැල්සිරිපුර පිහිටි මෑතකදී පූර්ණ හෙලීම්වලට ලක්වූ හෙක්ටයාර 1.5 ක පමණ බිම් ප්‍රමාණයක් මෙම පර්යේෂණ සඳහා යොදා ගන්නා ලදී. මෙම පර්යේෂණයේදි දැව නිෂ්පාදනය සඳහා කොපීස භාවිතා කිරීමට ඇති හැකියාව සොයා බලනුයේ නව බීජ පැල රෝපණය කිරීමකින් තොරවය. කොපීස 1 - 4 ත් අතර සංඛ්‍යාවක් වසර කීපයක් නඩත්තු කරනු ලැබේ. වියන් ස්ථරය ආවෘත වූ පසු ඉහල දැව පරිමාවක් නිශ්පාදනය කිරීමට වඩාත්ම යෝග්‍ය ශාක සංඛ්‍යාව මෙහිදී තෝරාගනු ලබන අතර ඒවා පර්යේෂණය අවසානය දක්වා නඩත්තු කරනු ලැබේ.

### 4.2.1.1.17. Leptozybe invasa නැමති පලිබෝධකයාට ප්‍රතිරෝධී ශාක විශේෂ හදුනා ගැනීමේ පර්යේෂණය - හල්දුම්මුල්ලේ හෙක්ටයාර 0.5 ක බිමකි.

Leptozybe invasa නැමති පලිබෝධකයා ගහන හල්දුම්මුල්ලේ පිහිටි බිම් කොටසක් තුල Eucalyptus විශේෂ ( E. microcorys, E. grandis, E. clocziana, E. robusta, E. citridora, E. toraliana ) ස්ථාපනය කර අදාල පලිබෝධකයාට දක්වන ප්‍රතිරෝධී බව පිළිබදව අගැයීමේ පර්යේෂණ කටයුතු නඩත්තු කර එම අගැයීම් අඛණ්ඩව සිදු කරන ලදී

### 4.2.1.1.18. දෙවන වරට තේක්ක ස්ථාපනය කිරීමේදී පැලෑටි වර්ධනය කිරීමේ පරීක්ෂණය - ඉනාමළුවේ හෙක්ටයාර 01 ක බිම් ප්‍රමාණය.

දෙවන වරට තේක්ක ස්ථාපනය කිරීමේ බිම්වල දක්නට ලැබෙන ප්‍රධාන ගැටළුවක් වන්නේ වල් පැලෑටි සමග ඇතිවන තරගයයි. දෙවන වරට තේක්ක වගා කරන බිම් වලට යෙදිය හැකි සාර්ථක වල් මර්ධනය කිරීමේ ක්‍රම හදුනා ගැනීම සදහා ක්ෂේත්‍ර මට්ටමේ පර්යේෂණ ආරම්භ කරන ලදි. මෙහිදි රසායනික ද්‍රව්‍ය 03 ක් සහ වල් නෙලිමේ ක්‍රම 02 ක් උපයෝගීකර ගන්නා ලදී.

## 4.2.1.2. ස්වභාවික වනාන්තර කලමනාකරණය හා සම්බන්ධ අධ්‍යයනයන් .

### 4.2.1.2.1 භායනයට පත්වූ වනාන්තරවල ප්‍රතිස්ථාපන කටයුතු සදහා තාක්ෂණික ක්‍රම යෙදීම.

ස්වභාවිකව පුනර්ජනනය වු බීජපැල වල වර්ධනය වැඩි දියුණු කරමින් භායනයට පත්වූ හෙක්ටයාර 3.00 ක භූමි ප්‍රමාණයක අදාල ප්‍රතිස්ථාපන ශිල්පීය ක්‍රම ක්‍රියාත්මක කර තිබෙන අතර ලැව් ගිනි වළක්වා වල් ඉවත් කර මෙම බිම් නඩත්තු කරනු ලැබේ.

## 4.2.1.3. දේශීය ශාක විශේෂ ගෘහස්ථකරණය කිරිම.

### 4.2.1.3.1. P. Marsupium (ගම්මාළු) - කුරුණෑගල , ඇත්ගල හෙක්ටයාර 0.5.

2010 වසරේදී ඇත්ගල ස්ථාපනය කරන ලද P. Marsupium සහ P. Macrocarpus යන විශේෂවල ඊලග පරම්පරාවන් අධ්‍යයනය කිරීමේ පර්යේෂණ කටයුතුවල ප්‍රගතිය ඇගැයීමකට ලක්කල අතර එම බිම් කොටස් නඩත්තු කරන ලදි.

## 4.3. ජාතික වන ක්ෂේත්‍ර පර්යේෂණ කමිටුව.

ජාතික වන ක්ෂේත්‍ර පර්යේෂණ කමිටුවේ කටයුතු සම්බන්ධිකරණය කිරීම තවදුරටත් මෙම අංශය විසින් සිදු කෙරේ. අදාල වර්ෂය තුල කමිටු රැස්වීම් 03 ක් පවත්වා තිබේ. නව පර්යේෂණ යෝජනා 12 ක් අගැයිමට ලක්කර පර්යේෂණ කටයුතු සිදු කිරිම සදහා අනුමැතිය ලබාදෙන ලදී. මෙයට අමතරව මේ වන විට කෙරීගෙන යන පර්යේෂණ ව්‍යාපෘති 04 ක් සදහා කාලය දීර්ඝ කිරීමට අවසර ලබා දී තිබේ.

### 2012 වසර තුලදී අනුමත කරන ලද පර්යේෂණ ව්‍යාපෘති

1. ආචාර්ය ටි. ඩී. සී. එම්. කේ. විජයසිරිවර්ධනගේ ජානමය තිරු සංකේත ඇතුලත් කර ආවේණික ඖෂධීය ශාක 10 ක ඖෂධීය ගුණාංග අධ්‍යයනය.

2. මහාචාර්ය ඩී. එම්. ඩී. යකන්දාවල මහත්මියගේ සහ ආචාර්ය කේ. යකන්දාවල මහතාගේ *Nymphaea nouohali* Burm.f හි වර්ගීකරණය පිළිබදව සිදුකල අධ්‍යයනය සහ දෙමුහුම් තක්සෝන හදුනාගැනීම.

3. මහාචාර්ය කේ.බී. රනවනගේ මිනිස් ක්‍රියාකාරිත්වය හේතුකොටගෙන වාසස්ථානවල සිදුවන වෙනස්කම් සහ පවත්නා සම්පත් ප්‍රමාණය අනුව වල් ප්‍රයිමේටාවන්ගේ හැසිරීම් සංකීර්ණත්වය සහ නුවරඑළියේ කදපොල පිහිටි සීතාඑළිය වන රක්ෂිතයේ *Trachypithecus vetulus* සහ *Semnopithecus entellus* පිළිබද සමීක්ෂණය.

4. ආර්. ඒ. එස්. ඩබ්ලිව්. රණසිංහ මහත්මියගේ සහ ඒ. එම්. ඒ. එස්. අත්තනායක මහතාගේ Gesneriaceae කුලයේ ( අප්‍රිකානු වයලට් කුළයේ ) පාරිසරික ව්‍යාප්තියට අනුව විශේෂවල සීමාවන් හදුනාගෙන ඒවායේ ව්‍යාප්තිය පිළිබදව අධ්‍යයනය කිරීම.

5. ඩබ්ලිව්. එම්. ආර්. එස්. කේ. වර්ණසූරිය මහත්මියගේ සහ ආචාර්ය ටී. සිවනන්තවර්ල් යන අයගේ වියලි සහ අතරමැදි කලාපවල වන වගාවල කාබන් සංචිත ඇස්තමේන්තු ගත කිරීම.

6. ආචාර්ය ඩී. විරකෝන් යන අයගේ *Semnopithecus vetulus* nestor ( දම් මුහුණැති කළු වදුරාගේ ) වාසස්ථාන භාවිතය, කණ්ඩායමේ විශාලත්වය හා සංයුතිය කෙරෙහි ඉඩම් පරිහරන රටාවේ බලපෑම.

7. ටී.ඒ.බී.ඩී. සංජීව මහතා, මහාචාර්ය ඩී. කේ. එන්. ජී. පුෂ්පකුමාර සහ මහාචාර්ය යූ. ආර්. සංගක්කාර යන අයගේ *Terminalia chebula* (අරළු) හි රූප විද්‍යාත්මක සහ ජානමය ලක්ෂණ ඒවායේ පාරිසරික ව්‍යාප්තිය හා සම්බන්ධවන ආකාරය.

8. එස්. ආර්. වීරවර්ධන මහතාගේ ශාකවල වාස්තු විද්‍යාව සහ භූවිෂමතා රටාවන් පදනම් කරගෙන නකල්ස් වනාන්තර ප්‍රදේශයෙන් උභයජීවීන් හමුවීමේ රටාව අධ්‍යයනය කිරීම.

9. ආචාර්ය එච්.එම්.එස්.පී. මඩවල මහත්මියගේ සහ ආචාර්ය ජී. ඒ. ඩී. පෙරේරාගේ දෝතළුගල මිනිසා සහ ජෛවගෝල රක්ෂිතයේ පාංශු බීජ බැංකුවේ අවකාශමය රටාවන් සහ විවිධත්වය අධ්‍යයනය කිරීම.

10. ආචාර්ය ආර්. එස්. එස්. ප්‍රනාන්දු සහ ආර්. එස්. ගුණසේකර මහතාගේ නැගෙනහිර අතරමැදි කලාපයේ පිහිටි බොහෝ දෙනෙකු නොදන්නා උඩකීරුව ඩිප්ටෙරෝකාපස් ප්‍රමුඛ වර්ෂා වනාන්තරයේ ජෛව විවිධත්වය පිලිබදව ලේඛණ ගත කිරීමේ සහ දැනුවත් කිරීම සදහා වන අධ්‍යයනය.

11. ආචාර්ය ඒ.එම්.ටී.ඒ. ගුණරත්නගේ සහ ආචාර්ය ඩේවිඩ් එෆ්.ආර්.පී. බර්ස්ලම් යන අයගේ Syzygium (Myrtaceae) ජෛවගෝල විද්‍යාව සහ වර්ගීකරණය පිළිබදව වූ අධ්‍යයනය.

12. ආචාර්ය කේ.එම්.ජී.ජී. ජයසූරියගේ ශ්‍රී ලංකාවේ කදුකර වනාන්තර ශාක විශේෂ සමහරක බීජවල සුප්තතාව සහ ප්‍රරෝහණ අවශ්‍යතාවයන් සහ ඒවා කෙරෙහි දේශගුණික විපර්යාසවල බලපැම අධ්‍යයනය කිරීම.

## දැනට සිදු කරන පර්යේෂණ ව්‍යාපෘති සදහා කාලය දීර්ඝ කිරීම් ලබාදීම

1. මහාචාර්ය කේ. බී. රණවනගේ නාඋල, මරගමුව පිහිටි අස්වැන්න ලබාගත් ඉයුකැලිප්ටස් වන වගාවේ ජෛව විවිධත්වය සංරක්ෂණය කිරීම

2. ආචාර්ය සුරේෂ් පී. බෙන්ජමින්ගේ ශ්‍රීලංකාවේ හමුවන Dendrobium සහ Bulbophyllum (Orchidaceae) ගණවල වර්ගීකරණය සංශෝධනය කිරීම.

3. ආචාර්ය ඒ. එම්. ටී. ඒ. ගුණරත්න මහත්මියගේ නකල්ස් වනාන්තර රක්ෂිතයේ කදුකර වනාන්තර විශේෂ පුනර්ජනනය කෙරෙහි *Ageratina riparia* විශේෂයේ බලපෑම.

4. ආචාර්ය ආර් එච්. ජී. රනිල්ගේ ශ්‍රී ලංකාවේ හමුවන ගස් පර්ණාංග (Cyatheaceae ) වල විවිධත්වය , වාසස්ථාන, ව්‍යාප්තිය සහ සංරක්ෂණ තත්වයන් හදුනාගැනීම.

## 4.4. වන විද්‍යා අධ්‍යාපනය

ශ්‍රී ලංකා වන විද්‍යායතනයේදී පහත සදහන් පුහුණු වැඩ සටහන් පවත්වන ලදී.

### 1. සාමාන්‍ය පුහුණු පාඨමාලා

අඩවි වන නිලධාරින් 32 ක් සදහා වසර 2 ක වන විද්‍යා ඩිප්ලෝමා පාඨමාලාව පවත්වන ලදි.

### 2. කෙටිකාලීන පුහුණු පාඨමාලා

- අළුතින් බදවාගත් දෙමළ මාධ්‍ය අඩවි වන නිලධාරින් සදහා සති දෙකක ආරම්භක වන විද්‍යා පුහුණු වැඩ සටහන පවත්වන ලදී. මෙයට නිලධාරින් 12 ක් සහභාගි වූහ.

- වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍ර නිලධාරින් සදහා පුනර්ජනනීය බලශක්ති සංවර්ධනය සදහා සම්පත් වෙන් කිරීම පිළිබදව දින දෙකක වැඩ මුළුවක් පවත්වන ලදී.

- වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ සංචාරක බංගලා භාරකරුවන් සදහා දින තුනක පුහුණු වැඩ සටහනක් පවත්වන ලදී. මේ සදහා බංගලා භාරකරුවන් 40 ක් සහභාගි වූහ.

- වන පාලකවරුන් සහ අඩවි වන නිලධාරින් සදහා වන විද්‍යාව සහ පරිසරය සම්බන්ධ පනත් සහ ආඥාපනත් පිළිබදව දින දෙකක පුහුණු වැඩ සටහනක් පවත්වන ලදී.

- ආයතනයේ අනෙකුත් නිලධාරින් සදහා කෙටි පුහුණු වැඩ සටහන් හතක් පවත්වන ලදී. (SLAS, ආරම්භක පුහුණු වැඩ සටහන - 2012, මෙහි උප මොඩියුලය වුයේ වන පුහුණුවයි.)

## 4.5. වැඩමුළු සහ සම්මන්ත්‍රණ

### ශ්‍රී ලංකාවේ UN – REDD වැඩ සටහන හා සම්බන්ධ වැඩමුළු.

දේශීය හා අන්තර් ජාතික ප්‍රවීණයින්ගේ සහභාගීත්වයෙන් ශ්‍රී ලංකාවේ UN – REDD වැඩ සටහනේ යෝජනාව සකස්කර අවසන් කිරීම සඳහා අවශ්‍ය කරන ලේඛන සමාලෝචනය කිරීමේ අරමුණින් උපදේශන රැස්වීම් සහ වැඩමුළු රැසක් පවත් වන ලදි. ( UN – REDD) යනු වන හරණය සහ වනාන්තර හායනය මගින් විමෝචනය අවම කිරීම පිලිබඳ එක්සත් ජාතීන්ගේ වැඩ සටහන)

### SAARC වැඩ මුළුව

වනාන්තර වලට පරිබාහිරව හමුවන ශාකවල සංවර්ධනය සහ නිෂ්පාදනය ඉහල නැංවීම සඳහා පාර්ශවකරුවන්ගේ සහභාගිත්වය මැයෙන්වූ වැඩමුළුවක් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සමග සම්බන්ධවී SAARC වන විද්‍යා මධ්‍යස්ථානය විසින් පවත්වන ලදි.

## 4.6. පුස්තකාලය

පුස්තකාලය සඳහා රුපියල් 909487.00 ක වටිනාකමින් යුක්ත ග්‍රන්ථ සහ සගරා මිලදී ගන්නා ලදි. මෙයට විවිධ මාතෘකා 25 ක් යටතේ පොත් සහ විවිධ මාතෘකා 10 ක් යටතේ වු සගරා ඇතුලත්වේ. තවද විවිධ මාතෘකා 37 ක් යටතේවු ග්‍රන්ථ 37 ක් පරිත්‍යාග ලෙස ලැබුණි.

CD – ISIS පුස්තකාල පැකේජය යොදාගනිමින් පුස්තකාල ග්‍රන්ථ නාමාවලිය මෙම වසරේදිද පරිගණක ගත කරන ලදී. අදාල වර්ෂය අවසානයේදි දත්ත 4,669 ක් මෙලෙස පරිගණක ගතකර තිබුණි. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව IUFRO (රුපියල් 65700.00) සහ APAFRI ( රුපියල් 32875.00 ) යන සාමාජිකත්වය එම අදාල මුදල් ගෙවා ඉදිරි වසර සඳහාද ලබාගෙන තිබේ.

## 4.7 වනවිද්‍යා තොරතුරු සේවාව.

මහජනතාව සඳහා විදේශික ශාක විශේෂ හදුනාගැනීම, භාවිතා කිරීම සහ වගා කිරීම පිලිබඳ මුලික සහ සරල තොරතුරු ලබාදීමේ අරමුණින් ශාක හදුනාගැනීමේ තොරතුරු පොතක් සකස් කිරීමේ කටයුතු ආරම්භ කරන ලදි. මෙහි පළමුවන වෙළුම සඳහා විවිධ අරමුණු වලින් විවිධ අවස්ථාවලදි ශ්‍රී ලංකාවට හදුන්වාදුන් විදේශීය ශාක 40 ක් පිලිබඳ තොරතුරු ඉදිරිපත් කිරීමට අපේක්ෂිතයි.

- කිතුල් සම්බන්ධ අත්පොතක් මුද්‍රණය කරන ලදි.
- වන විද්‍යා පර්යේෂණ මධ්‍යස්ථානයේ වාර්ෂික ප්‍රකාශනය වන, වන විද්‍යා පර්යේෂණ ප්‍රවෘත්ති පත්‍රිකාව මෙම වසරේදීද වන විද්‍යාවේ විවිධ පැතිකඩ පිළිබඳ විස්තර දක්වමින් එළි දක්වන ලදි.
- රතු කද ගුල්ලාගේ සහ කළු රිකිලි ගුල්ලාගේ සිදුවන හානි පිළිබඳ උපදේශාත්මක පත්‍රිකා දෙකක් සකස් කරන ලදි.

## 4.8. ප්‍රකාශන

- කේ. එම් ඒ. බණ්ඩාර මහතාගේ (2010/11) තේක්ක වල මූලික අවධියේ වර්ධනය කෙරෙහි භූමිය සකස් කිරීම, ශාක වර්ගය සහ අකාබනික පොහොර යෙදීම යන කරුණුවල බලපෑම - තේක්ක දෙවන වර සිටුවීමේ පරීක්ෂණය - 1 වන අදියර , ශ්‍රී ලංකා ෆොරස්ටර් 32 සහ 33 : 51 – 63

- කේ. එම්. ඒ. බණ්ඩාර මහතාගේ (2010/11) තේක්ක වල මූලික අවධියේ වර්ධනය කෙරෙහි භූමිය සකස් කිරීම, ශාක වර්ගය සහ පොහොර යෙදීම යන කරුණුවල බලපෑම - තේක්ක දෙවන වර සිටුවීමේ පරීක්ෂණය - 11 වන අදියර , ශ්‍රී ලංකා ෆොරස්ටර් , 32 සහ 33 : 71 – 80

- කේ. එම්. ඒ. බණ්ඩාර මහතාගේ (2010/11) ශ්‍රී ලංකාවේ වන ශාක අභිජනන වැඩ සටහන් හා ඒවායේ ප්‍රගතිය, රුක්, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව.

- එස්. එච්. බන්ධුමාලා මහත්මියගේ (2012) ශ්‍රී ලංකාවේ කොස්ලන්ද ප්‍රදේශයේ පිහිටි භායනයට පත්වූ වනාන්තරයක ස්වභාවික පුනර්ජනනය සඳහා ජෛව ස්කන්ධයේ සහ ගහණ ඝනත්වයේ වෙනස්කම්වල බලපෑම.

- එන්. එම් පැසිවික්ස්නික් සහ එන්. ඩී. ආර් . වීරවර්ධන මහතාගේ (2010/11) පුත්තලම් දිස්ත්‍රික්කයේ විදේශීය ශාක විශේෂයක් වන *Prosopis juliflora* Sw (Dc) ආක්‍රමණය, ව්‍යාප්තිය, නව වාර්තාවීම් සහ ගතයුතු ක්‍රියා මාර්ග ශ්‍රී ලංකා ෆොරස්ටර් 32 සහ 33 : 43 – 49.

- එන්. ඩී. ආර්. වීරවර්ධන මහතාගේ( 2010/11 ) ශ්‍රී ලංකාවේ අතරමැදි කලාපයේදී පොහොර සහ සිටුවීමට භාවිතා කරන වලේ ගැඹුර කෙරෙහි නොමේරූ තේක්කවල ප්‍රතිචාරය ශ්‍රී ලංකා ෆොරස්ටර් 32 සහ 33 : 63–70.

## 4.9 අංශයේ මූල්‍යමය කාර්ය සාධනය

මෙම අංශයට ලැබුණු සම්පූර්ණ ප්‍රතිපාදන ප්‍රමාණය වන රුපියල් මිලියන 21.40 ක මුදලින් රුපියල් මිලියන 14.49 ක් වියදම් කරන ලදී.

## 05 වන පරිච්ඡේදය
## වන ආරක්ෂණ සහ නීති ක්‍රියාත්මක කිරීමේ අංශය

### 5.1 හැඳින්වීම

වන ආරක්ෂණ සහ නීති ක්‍රියාත්මක කිරීමේ අංශයේ ප්‍රධාන අරමුණ වන්නේ, නීතිමය ආරක්ෂාව තහවුරු කර, වටිනා ස්වභාවික වනාන්තර, වන වගා සහ එහි සිටින වන ජීවීන්ද, අනෙකුත් ජෛව විවිධත්වය සඳහා දායකවන සම්පත්ද, සුරැකීමට සහ සංරක්ෂණය කිරීමට සහාය වී, එමඟින් වනාන්තර වලින් සැපයෙන පාරිසරික සේවාවන් සහ වනජ නිෂ්පාදන අඛණ්ඩව සැපයීමට, රජයට අයත් වන සම්පත් වලට ලැබිය යුතු නීතිමය ආරක්ෂාව සැපයීමයි. මීට අමතරව ප්‍රාදේශීය කාර්ය මණ්ඩලය, හදිසි වැටලීම් අංශය සහ දැව පරීක්ෂා කිරීමේ මධ්‍යස්ථාන හරහා, වන නීතිය ක්‍රියාත්මක කිරීමේ කටයුතු සිදු කරයි.

### 5.2 ප්‍රධාන ක්‍රියාකාරකම්

වන ආරක්ෂණ සහ නීති ක්‍රියාත්මක කිරීමේ අංශයේ ප්‍රධාන ක්‍රියාකාරකම් පහත දක්වා තිබේ.

i. වන ආඥා පනතේ පරිපාලනමය කටයුතු.

ii. වන ආඥා පනත යටතේ වනාන්තර ප්‍රකාශයට පත් කිරීම.

iii. දැව පදනම් කරගත් කර්මාන්ත සහ දැව ප්‍රවාහනය පාලනය කිරීම.

iv. රජයේ වනාන්තර සම්පත්, භෞතික වශයෙන් ආරක්ෂා කිරීම සහ පාලනය කිරීම.

v. වන සංරක්ෂණ දෙපාර්තමේන්තු අරමුදලේ, පරිපාලන කටයුතු සිදු කිරීම.

vi. දැව සහ දැව නොවන වනජ ද්‍රව්‍ය අපනයනය පාලනය කිරීම

### 5.3. ආයතනික සැකැස්ම

මෙම වසර තුලදී මෙම අංශය, ප්‍රධාන කාර්යාලයේ සිටින එක් සහකාර වන සංරක්ෂකවරයකුගේ සහ එක් ජ්‍යෙෂ්ඨ වන පාලකවරයකුගේ සහාය ඇතිව ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය වන සංරක්ෂක වරයකු විසින් මෙහෙයවන ලදී.

දිසා වන නිලධාරීන් 24 දෙනාට සහ ඔවුන්ගේ ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලයට, අදාල දිසාවන්හි පිහිටි රජයේ වනාන්තර ආරක්ෂා කිරීම සහ නීති ක්‍රියාත්මක කිරීම යන කටයුතු වල වගකීම පැවරී තිබේ.

ප්‍රාදේශීය ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලය හැරුණ විට ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය වන සංරක්ෂක / කලාප නියෝජ්‍ය වන සංරක්ෂක / අදාල දිසාවන්හි දිසා වන නිලධාරීන්ගේ අධීක්ෂණය සහ මඟ පෙන්වීම යටතේ සෘජුවම ක්‍රියාත්මක වන, නීති ක්‍රියාත්මක කිරීමේ පහත සඳහන් ඒකක වේ.

| | | | |
|---|---|---|---|
| i) | හදිසි වැටලීම් අංශ | - | 05 |
| ii) | ස්ථිර දැව පරීක්ෂා කිරීමේ මධ්‍යස්ථාන<br>(හංවැල්ල, දඹුල්ල, තණමල්විල, පස්යාල,) | - | 04 |

ප්‍රධාන කාර්යාලයේ හදිසි වැටලීම් අංශය අඩවි වන නිලධාරීන් 01, බීට්ටු වන නිලධාරීන් 03, වන ක්ෂේත්‍ර සහකාරවරු 02 යන ලෙස සමන්විත වන අතර විශේෂ වන පාලකවරයෙකුගේ අධීක්ෂණය යටතේ පවතී. මෙය නීති විරෝධී ක්‍රියාකාරකම් මැඩ පැවැත්වීම සඳහා කටයුතු කරයි.

අදාල දිසා වන නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ, දැව පරීක්ෂා කිරීමේ මධ්‍යස්ථාන ක්‍රියාත්මක වන අතර, මෙම ඒකක ජ්‍යෙෂ්ඨ අඩවි වන නිලධාරියෙකුගේ මූලිකත්වයෙන් ක්‍රියා කරයි.

## 5.4. ක්‍රියාකාරකම් පිළිබඳ සාමාන්‍ය සමාලෝචනයක්

ආරක්ෂණය සහ සම්බන්ධ ප්‍රධාන කාර්ය භාරය දිසාවන් 24 ට අනුබද්ධ කරන ලද ප්‍රාදේශීය කාර්ය මණ්ඩලය විසින් ඉටු කරයි. 2012 වසර තුලදී මෙම දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලය විසින් වන අපරාධ 3009 ක් නීතියට හසුකරගෙන තිබේ.

මහජනයාගෙන් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය වන සංරක්ෂක වෙත හෝ වන සංරක්ෂක ජනරාල් වෙත හෝ අමාත්‍යාංශය වෙත සෘජුව ලැබෙන තොරතුරු මත මහා පරිමානයේ වන අපරාධ වැටලීම සඳහා ප්‍රධාන කාර්යාලයේ හදිසි වැටලීම් අංශය යෙදවීමට ක්‍රියා කරයි.

වන ආඥා පනතේ නියෝගවලට අනුකූලව දවසේ පැය 24 පුරාම නීති විරෝධී දැව ප්‍රවාහනයන් අල්ලා ගැනීම සඳහා ස්ථිර දැව පරීක්ෂා කිරීමේ මධ්‍යස්ථාන ක්‍රියාත්මක වේ.

දැව ඉරුම්හල්, දැව අලෙවිසැල්, යාන්ත්‍රික සහ යාන්ත්‍රික නොවන වඩුමඩු, දර අලෙවිසැල් ආදිය ලියාපදිංචි කිරීම, දිසා වන නිලධාරීන්ගේ සහ ප්‍රාදේශීය ලේකම් වරුන්ගේ නිර්දේශ මත කලාප කාර්යාල වලින් සිදු කරනු ලැබේ.

මෙම වසරේදී අති විශේෂ ගැසට් 44 ක් නිකුත් කරන ලද අතර, සංරක්ෂිත වනාන්තර 08 ක් හා රක්ෂිත වනාන්තර 60 ක් ප්‍රකාශයට පත් කරන ලදී.

## 5.5. 2012 වසර තුළ ප්‍රගතිය

### 5.5.1. සාමාන්‍ය

නීති විරෝධී දැව හෙළීම්, එළි පෙහෙළි කිරීම්, ප්‍රවාහනය, මැණික් ගැරීම්, රජයේ දැව සන්තකයේ තබාගැනීම සහ පුද්ගලික දැව ව්‍යාපාර ලියාපදිංචි නොකිරීම ආදිය ඇතුලත් වන අපරාධ 3009 ක් 2012 වසර තුලදී වාර්තා කරන ලදී.

දෙපාර්තමේන්තුව විසින් නීති විරෝධී දැව සන්තකයේ තබාගැනීම් 210 ක් පිළිබඳව අවසන් තීරණය ගන්නා ලද අතර, ඉතිරි අපරාධ 2799 උසාවියට ඉදිරිපත් කරන ලදී. ඒවාට පුද්ගලයින් 3,400 ක් අදාල වී තිබේ. මේවාට අයත් නඩු 17 කදී පුද්ගලයින් සිරගත කරන ලද අතර, තවත් නඩු 10 කදී අදාල පුද්ගලයින්ට දැඩි ලෙස අවවාද

කර තිබේ. තවත් නඩු 1538 කදී වැරදිකරුවන්ගෙන් රු. 29,621,181.45 ක මුදලක් දඩ ලෙස අය කරගෙන තිබේ. රාජසන්තක කරන ලද ලොරි 19, ලෑන්ඩ් මාස්ටර් 50, බවුසර් 01, JCB 01, වෑන් 01, යතුරු පැදි 01, පාපැදි 01 හි මුළු වටිනාකම රු.39849000.00 කි. වන අපරාධ පිළිබඳ වැඩිදුර විස්තර ඇමුණුම් VI , VII , සහ VIII මගින් දැක්වේ.

### 5.5.2. හදිසි වැටලීම් ඒකකයන්හි කාර්ය සාධනය

හදිසි වැටලීම් ඒකකයන්ගේ කාර්ය සාධනය පහත 5.1 වගුවේ දක්වා තිබේ.
(ඇමුණුම IX )

**වගුව 5.1 හදිසි වැටලීම් අංශයේ ප්‍රගතිය**

| ඒකකයේ නම | වන අපරාධ සංඛ්‍යාව | දැව පරිමාව (ඝන මීටර) | දැව වටිනාකම (රු) | දඩය (රු) |
|---|---|---|---|---|
| ප්‍රධාන කාර්යාලය | 01 | - | - | - |
| කොළඹ කලාපය | 34 | 11.61 | 320,232.03 | 272,500.00 |
| රත්නපුර කලාපය | 02 | 0.549 | 35,466.94 | 21,000.00 |
| අනුරාධපුර කලාපය | 15 | 122.772 | 3,030,406.98 | 6,500.00 |

### 5.5.3 දැව පරීක්ෂණ මධ්‍යස්ථාන

2012 වසර තුලදී හංවැල්ල, තණමල්විල, දඹුල්ල සහ පස්යාල යන ස්ථානවල දැව පරීක්ෂණ මධ්‍යස්ථාන ක්‍රියාත්මක විය.

### 5.5.4. පුද්ගලික දැව ව්‍යාපාර

2012 වසර තුලදී දැව ඉරුම් හල් 342 ක් , දැව අලෙවිසැල් 612, යාන්ත්‍රික වඩු මඩු 632, යාන්ත්‍රික නොවන වඩුමඩු 97, ගෘහභාණ්ඩ වෙළඳසැල් 729 සහ දර විකුණුම්හල් 118 ක් අළුතින් ලියා පදිංචි කරන ලදී.

පෙර වාර්තාවලට අනුව (2011) ලියාපදිංචි මුළු පුද්ගලික දැව ව්‍යාපාර සංඛ්‍යාව 22665 ක් වන අතර, 2012 වසරේදී පුද්ගලික දැව ව්‍යාපාර සංඛ්‍යාව 25195 ක් ලෙස වාර්තා වී තිබේ.. (ඇමුණුම X සහ XI )

### 5.5.5. පුහුණු වැඩ සටහන්

පහත සඳහන් දැනුවත් කිරීමේ සහ පුහුණු කිරීමේ වැඩ සටහන් අදාල වර්ෂය තුලදී සිදුකරන ලදී.

- i. පොලිස් නිලධාරීන් 490 ක් සඳහා දැනුවත් කිරීමේ වැඩ සටහන් 08 ක් පවත්වන ලදී.
- ii. ප්‍රාදේශීය ලේකම්වරුන් 1049 ක් සඳහා දැනුවත් කිරීමේ වැඩ සටහන් 30 ක් පවත්වන ලදී.
- iii. වන නිලධාරීන් 594 ක් සඳහා, දැනුවත් කිරීමේ වැඩසටහන් 28 ක් සිදුකරන ලදී.
- iv. වෙනත් පුද්ගලයින් 15020 ක් සඳහා, දැනුවත් කිරීමේ වැඩ සටහන් 476 ක් පවත්වන ලදී.
- v. වන පාලකවරුන් 45 ක් සඳහා විනය කළමනාකරණ පුහුණු වැඩ සටහනක් පවත්වන ලදී.
- vi. වන නිලධාරීන් 431 ක් සඳහා ගිනි අවි පුහුණු වීම් 11 පවත්වන ලදි.

( ඇමුණුම XII )

### 5.6 ත්‍යාග මුදල් ලබා දීම

2012 වසර තුලදී රුපියල් 3,833,982.28 ක මුදලක් නිලධාරීන් 853 ක් සහ තොරතුරු ලබාදුන් පුද්ගලයින් 52 ක් අතර බෙදා දෙන ලදි මෙම නඩුවලදී අදාල පුද්ගලයින් උසාවිය විසින් වරදකරුවන් බවට තීන්දු කර තිබේ. වැඩිදුර විස්තර ඇමුණුම XIII හි දක්වා ඇත.

### 5.7 වන ආරක්ෂණ කණ්ඩායම් රැස්වීම්

දිස්ත්‍රික් ලේකම්ගේ මූලිකත්වයෙන් පවත්වන ලද දිස්ත්‍රික් වන ආරක්ෂණ රැස්වීම් වලදී, ඒ ඒ දිස්ත්‍රික්කවල වන ආරක්ෂණ කටයුතු සමාලෝචනය කරන ලදී. 2012 වසර තුල මෙවැනි රැස්වීම් 112 ක් පවත්වන ලදී. (ඇමුණුම XIV).

### 5.8 වනාන්තර ඉඩම් නිදහස් කිරීම

2012 වසර තුලදී වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ පාලනය යටතේ වූ හෙක්ටයාර 588.110 ක භූමි ප්‍රමාණයක් විවිධ කටයුතු සඳහා නිදහස් කරන ලදී. (ඇමුණුම XV).

## 5.9. මුල්‍යමය ප්‍රගතිය

**වගුව : 5.2 වන සංරක්ෂණ දෙපාර්තමේන්තු අරමුදලේ මුල්‍යමය ප්‍රගතිය**

| විෂය | ප්‍රතිපාදන | වියදම |
|---|---|---|
| වන සංරක්ෂණ දෙපාර්තමේන්තු නිලධාරීන්ට සහ අනෙකුත් තොරතුරු සැපයුවන්ට ලබාදුන් ත්‍යාග මුදල් ( 604 A) | 5,184,100.00 | 5,130,000.00 |
| ගමන් වියදම් (උසාවි) (604 B) | 4,150,862.22 | 3,915,000.00 |
| වන ආරක්ෂණ ක්‍රියාකාරකම් ( 604 C) | 2,000,000.00 | 4,800,396.72 |
| පුහුණු වීම් ( 604 D) | 300,000.00 | 277,835.00 |
| වෙනත් (බලපත්‍ර පොත් මුද්‍රණය , ගැසට් ප්‍රකාශයට පත් කිරීම ආදිය) (604 E) | 500,000.00 | 32,665.00 |

5.9.1. අදාල වර්ෂය තුල ආරක්ෂණ සහ නීතී ක්‍රියාත්මක කිරීමේ අංශයේ මුල්‍යමය ප්‍රගතිය 47.9 % කි. වියදම් පිළිබඳ වැඩිදුර තොරතුරු පහත දැක්වේ. අදාල වර්ෂය සඳහා ලද සම්පූර්ණ ප්‍රතිපාදන ප්‍රමාණය රු.13,000,000.00 කි. 2012 වසර අවසන් වන විට නිල ඇඳුම් සඳහා වැය කල මුදල රු.6239986.88 කි. (ඇමුණුම XVI ).

## 5.10. වනජ නිෂ්පාදන අපනයනය කිරීම

ශාක, බීජ සහ අනෙකුත් වනජ නිෂ්පාදන අපනයනය කිරීම සඳහා අනුමැතිය ලබාදෙන ලදි. එක්දින සේවාවෙන් රුපියල් 797,845.00 ක්ද , සාමාන්‍ය සේවාවෙන් රුපියල් 812,563.50 ක්ද, ශාක සහ බීජ අපනයනය සඳහා බලපත්‍ර නිකුත් කිරීම තුලින් උපයා ගන්නා ලදී. තවද ඉරූ දැව , ගෘහ භාණ්ඩ, අත්කම්, සෙල්ලම්බඩු සහ අගය එකතු කරන ලද දැව නිෂ්පාදන අපනයනය කිරීම සඳහා බලපත්‍ර නිකුත් කිරීමේ එක් දින සේවාව මගින් රුපියල් 2,106,224.00 ක්ද සාමාන්‍ය සේවාව මගින් රු.721,142.00 ක්ද මෙම වර්ෂය තුලදී උපයන ලදී. ඉහත සඳහන් සියළුම සේවාවලින් උපයාගන්නා ලද මුළු අදායම රුපියල් 4,437,774.50 කි.. (ඇමුණුම. XVII, XVIII, XIX සහ XX )

## 5.11 ගෘහ භාණ්ඩ සහ දැව ප්‍රවාහනය සඳහා බලපත්‍ර නිකුත් කිරීම මගින් ලද ආදායම.

රත්මලාන සහ ප්‍රධාන කාර්යාලය මගින් දැව සහ ගෘහ භාණ්ඩ ප්‍රවාහනය කිරීම සඳහා ප්‍රවාහන බලපත්‍ර 16,494ක් නිකුත් කිරීම මගින් රු. 2,770,992.00 ක ආදායමක් උපයන ලදී. (ඇමුණුම XXI සහ XXII )

## 5.12 විවිධ වර්ගයේ වාර්ෂික බලපත්‍ර නිකුත් කිරීම සහ ඉන් ලද ආදායම.

2012 වසර තුලදී විදුලි සංදේශ කුළුණු, ජල විදුලි බලාගාර, වන සෙනසුන් සඳහා බලපත්‍ර නිකුත් කිරීම සහ අනෙකුත් කටයුතු සඳහා බලපත්‍ර නිකුත් කිරීම මගින් උපයාගන්නා ලද මුළු අදායම රු.14870752.50 කි. (ඇමුණුම XXIII )

## 06 වන පරිච්ඡේදය

## සැලසුම් හා ප්‍රගති පාලන අංශය

### 6.1 හැඳින්වීම

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ විවිධ ක්‍රියාකාරකම් වලට අදාළ වාර්ෂික සැලසුම් සකස් කිරීමේ ප්‍රධාන වගකීම පැවරී ඇත්තේ සැලසුම් හා ප්‍රගති පාලන අංශය වෙතයි. වාර්ෂික සැලසුම් හා අයවැය සකස් කිරීම වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අයවැය හා සම්බන්ධ වන සියළුම ව්‍යාපෘතිවල ප්‍රගතිය සමාලෝචනය කිරීම සහ ප්‍රගතිය වාර්තා කිරීම සහ නව ව්‍යාපෘති සඳහා වාර්තා සැකසීම සැලසුම් හා ප්‍රගති පාලන අංශයේ ප්‍රධාන කර්තව්‍යයන් වේ.

### 6.2 මෙම අංශයේ ප්‍රධාන අරමුණු

i. අදාල වර්ෂය සඳහා දෙපාර්තමේන්තුවේ අය වැය ඇස්තමේන්තු සැකසීම.

ii. ප්‍රාග්ධන අයවැය යටතේ මුල්‍යමය බැඳීම් ඇතුළු වාර්ෂික වැඩසටහන දෙපාර්තමේන්තුව වෙනුවෙන් සැලසුම් කිරීම.

iii. දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරන ලද ක්‍රියාකාරකම් පිළිබඳව මාසික ප්‍රගතිය සමාලෝචනය කිරීම සහ පරිසර අමාත්‍යාංශය ඇතුළු විවිධ ආයතයන වලට ප්‍රගතිය වාර්තා කිරීම.

iv. විදේශ අරමුදල් සහ ඒකාබද්ධ අරමුදල් ලබා ගැනීම සඳහා ව්‍යාපෘති වාර්තා සකස් කිරීම.

v. නව ගොඩනැගිලි ඉදි කිරීම සහ දැනට තිබෙන ගොඩනැගිලි අළුත්වැඩියා කිරීම මගින් දෙපාර්තමේන්තුවට අවශ්‍ය කරන යටිතල පහසුකම් ගොඩ නැංවීම.

vi. වාර්ෂික කාර්ය සාධන වාර්තාව සිංහල, දෙමළ, ඉංග්‍රීසි යන භාෂා මාධ්‍ය තුනෙන්ම පිළියෙල කිරීම හා එම වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කිරීම සඳහා ඉදිරිපත් කිරීම.

### 6.3 ආයතනික සැකැස්ම

සැලසුම් හා ප්‍රගති පාලන අංශය, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය වන සංරක්ෂකවරියකගේ පාලනය යටතේ පවතී. ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය වන සංරක්ෂකට සිය විවිධ රාජකාරි කටයුතු සඳහා සහාය ලබාදීමට එක් කළමනාකාර සහකාරවරයෙක්, ඩීට්ටු වන නිලධාරීන් දෙදෙනෙකු සහ කම්කරුවන් දෙදෙනෙකු මෙම අංශයට අනුයුක්ත කර ඇත.

## 6.4 ප්‍රධාන ක්‍රියාකාරකම්

මෙම වාර්තා කරන කාලය තුළ පහත සඳහන් ප්‍රධාන ක්‍රියාකාරකම්, සැලසුම් සහ ප්‍රගති පාලන අංශය විසින් සිදු කරන ලදී.

### 6.4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සහ ප්‍රාග්ධන අයවැය සකස් කිරීම

2012 වසර සදහා දෙපාර්තමේන්තුවේ වාර්ෂික වැඩසටහන සහ 2013 වසරේ දෙපාර්තමේන්තුවේ අවශ්‍යතාවයන් සියල්ල සැලකිල්ලට ගෙන, 2013 වසර සඳහා වාර්ෂික ප්‍රාග්ධන අයවැය සකස් කරන ලදී.

### 6.4.2 ප්‍රගති වාර්තා සැපයීම

ප්‍රාග්ධන අයවැය යටතේ ක්‍රියාත්මක කරන ලද වැඩසටහන්වල ප්‍රගතිය මසකට වරක් සහ කාර්තුවට වරක් වශයෙන් පරිසර අමාත්‍යාංශය වෙත යවන ලදී. වෙනත් විවිධ ආයතන වෙත ඒවායේ ඉල්ලීම සහ අවශ්‍යතාව අනුව වරින් වර ප්‍රගති වාර්තා ඉදිරිපත් කරන ලදී.

මහින්ද චින්තන වැඩසටහන සඳහා දිගු කාලීන හා කෙටි කාලීන සැලසුම් සකස් කිරීම, කාර්තුවකට වරක් සහ වාර්ෂිකව වාර්තා සකස් කිරීම, මෙම වසර තුලදී සිදු කරන ලදී. හරිත ලංකා වැඩ සටහන සඳහාද සැලසුම් සකස් කරන ලදී.

අදාල කාලය තුලදී, 2011 වසර තුල දෙපාර්තමේන්තුව විසින් සිදුකල ක්‍රියාකාරකම් පිළිබඳ සියළු තොරතුරු අඩංගු කාර්ය සාධන වාර්තාවක් සකස් කරන ලදී.

### 6.4.3. ගොඩනැගිලි ඉදිකිරීම සහ අළුත්වැඩියාව

#### 6.4.3.1 ගොඩනැගිලි ඉදිකිරීම

සමාලෝචනය සිදු කල වසර තුලදී ඒකාබද්ධ අරමුදලේ, මුදල් උපයෝගී කර ගනිමින් පහත සඳහන් ඉදි කිරීම් කටයුතු සිදු කරන ලදී. මේ පිළිබඳ වැඩිදුර තොරතුරු වගුව 6.1 මගින් දැක්වේ.

**වගුව 6.1 ඒකාබද්ධ අරමුදල උපයෝගී කර ගනිමින් ඉදි කල ගොඩනැගිලි පිළිබඳ තොරතුරු - 2012**

| දිසාව | ගොඩනැගිල්ල |
|---|---|
| මුලතිව් | 1. අඩවි වන කාර්යාලය - මුලතිව් |
| කිලිනොච්චි | 2. අඩවි වන කාර්යාලය - කිලිනොච්චි |
| මන්නාරම | 1. අඩවි වන කාර්යාලය - මඩුරෝඩ් |

ඉහත වැඩසටහනේ මූල්‍යමය කාර්ය සාධනය පහත දැක්වේ ( වගුව 6.2)

**වගුව 6.2 2012 වසර තුල ගොඩනැගිලි ඉදිකිරීම හා සම්බන්ධ මූල්‍යමය කාර්ය සාධනය**

| අරමුදල | වාර්ෂික ප්‍රතිපාදන (රුපි.) | වියදම (රුපි.) | ප්‍රගතිය (%) |
|---|---|---|---|
| ඒකාබද්ධ අරමුදල | 9100000.00 | 9099784.79 | 99.99 |

### 6.4.3.2 ගොඩනැගිලි නඩත්තු කිරීම

මෙම වසර තුලදී ගොඩනැගිලි නඩත්තු කිරීමේ වැඩ සටහන් ක්‍රියාත්මක කරන ලදී. මේ පිළිබඳ වැඩිදුර විස්තර වගුව 6.3 මගින් දැක්වේ.

**වගුව 6.3 : වර්ෂ 2012 තුල නඩත්තු කරන ලද ගොඩනැගිලි වල තොරතුරු.**

| ගොඩනැගිල්ල | ස්ථානය |
|---|---|
| කලාප කාර්යාල | 1. රත්නපුර<br>2. නුවරඑළිය<br>3. අනුරාධපුර |
| දිසා වන කාර්යාල | 1. රත්නපුර<br>2. හම්බන්තොට<br>3. මාතලේ<br>4. අම්පාර<br>5. අනුරාධපුර<br>6. කුරුණෑගල |
| දිසා වන නිලධාරි නිල නිවාස | 1. ත්‍රිකුණාමලය<br>2. මඩකලපුව<br>3. කළුතර<br>4. පුත්තලම |
| වන පාලක නිල නිවාස | 1. මාතලේ |
| අඩවි වන කාර්යාල | 1. රත්නපුර - රක්වාන<br>2. රත්නපුර - බලංගොඩ<br>3. රත්නපුර - කලවාන<br>4. ගාල්ල - නෙළුව<br>5. හම්බන්තොට - හම්බන්තොට<br>6. මාතර - කඹුරුපිටිය<br>7. මාතර - අකුරැස්ස<br>8. මහනුවර - නාවලපිටිය<br>9. මහනුවර - තෙල්දෙනිය |

| | |
|---|---|
| | 10. මොණරාගල - වැල්ලවාය<br>11. මොණරාගල - බිබිල<br>12.පොළොන්නරුව - දිඹුලාගල<br>13. මුලතිව් - මුලතිව්<br>14. කිලිනොච්චි - කිලිනොච්චි<br>15. කුරුණෑගල - මැල්සිරිපුර<br>16. කුරුණෑගල - මහව |
| අඩවි වන නිලධාරී නිල නිවාස | 1.රත්නපුර - රත්නපුර<br>2.රත්නපුර - රක්වාන<br>3.කෑගල්ල - රඹුක්කන<br>4.කෑගල්ල - දෙහිඕවිට<br>5.හම්බන්තොට - තිස්ස<br>6. මාතර - මාතර<br>7. මහනුවර - තෙල්දෙනිය<br>8. බදුල්ල - වැලිමඩ<br>9. මොණරාගල - බිබිල<br>10. අම්පාර - අම්පාර<br>11. අනුරාධපුර - කහටගස්දිගිලිය<br>12. පොළොන්නරුව - පොළොන්නරුව<br>13. කුරුණෑගල - මහව<br>14. කළුතර - ඉංගිරිය<br>15. පුත්තලම - හලාවත |
| බීට්ටු වන නිලධාරී නිල නිවාස | 1.රත්නපුර - කුකුලේගම<br>2.රත්නපුර - පොතුපිටිය<br>3.රත්නපුර - රත්ගඟ<br>4.රත්නපුර - තුඹතැන්න<br>5.රත්නපුර - දියවේල්ල<br>6. රත්නපුර - වැද්දාගල<br>7. රත්නපුර - ඇඹිලිපිටිය<br>8.කෑගල්ල - නුගවෙල<br>9. ගාල්ල - වත්තහේන<br>10. හම්බන්තොට - උස්වැව<br>11. හම්බන්තොට - ලුණුගම්වෙහෙර<br>12. හම්බන්තොට - බෝගහපැලැස්ස<br>13. හම්බන්තොට - කටුවන<br>14. මාතලේ - ඉනාමළුව<br>15. මාතලේ - ගලේවෙල<br>16. මහනුවර - පන්විල<br>17. බදුල්ල - ඇල්ල<br>18. බදුල්ල - මීගහකිවුල<br>19. බදුල්ල - කන්දකැටිය<br>20. බදුල්ල - රිදීමාලියද්ද<br>21. බදුල්ල - ස්ප්‍රිංවත්ත |

| | |
|---|---|
| | 22. බදුල්ල - ඌවපරණගම<br>23. අම්පාර - අම්පාර<br>24. අනුරාධපුර - පූනෑව<br>25. අනුරාධපුර - තලාව<br>26. අනුරාධපුර - මිහින්තලේ<br>27. අනුරාධපුර - මැදවච්චිය<br>28. ත්‍රිකුණාමලය - අභයපුර<br>29. පොළොන්නරුව - ඇලහැර<br>30. පොළොන්නරුව - හබරණ<br>31. කුරුණෑගල - පන්නල , දික්කැලේ<br>32. කුරුණෑගල - නිකවැහැර<br>33. කුරුණෑගල - හේනේගෙදරලන්ද<br>34. කළුතර - මෝල්කාව |
| සංචාරක බංගලා | 1. මාතර - නාදුගල<br>2. බදුල්ල - හාලිඇල |
| තවාන් ගොඩනැගිලි | 1. පුත්තලම - ඉගිනිමිටිය |
| තොරතුරු මධ්‍යස්ථාන | 1. ගාල්ල - කොට්ටව |
| ක්ෂේත්‍ර පරීක්ෂණ බංගලා | 1. මඩකලපුව |
| දැව පරීක්ෂණ මධ්‍යස්ථාන | 1. කළුතර - අවිත්තාව |

සමාලෝචනය සිදු කරන වසර තුල ගොඩනැගිලි නඩත්තු කිරීමේ වැඩසටහනේ මූල්‍යමය ප්‍රගතිය පහත දැක්වේ. (වගුව 6.4 )

**වගුව 6. 4. ගොඩනැගිලි නඩත්තුව - මූල්‍යමය ප්‍රගතිය 2012**

| වාර්ෂික ප්‍රතිපාදන (රුපි.) | වියදම (රුපි.) | ප්‍රගතිය (%) |
|---|---|---|
| 18200000.00 | 18198547.80 | 99.99 |

## 07 වන පරිච්ඡේදය
## පිරිස් හා පාලන අංශය

### 7.1. හැදින්වීම.

නියමිත පරිපාලන රාමුවක් තුල, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ මානව සම්පත් කළමණාකරණය කිරීමේ වගකීම පැවරී තිබෙන්නේ පිරිස් හා පාලන අංශය වෙතයි. මෙම අංශය මගින්, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ සමස්ත පිරිස් හා පාලන කටයුතු සිදු කෙරේ. වර්තමානයේදී වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ සේවක සංඛ්‍යාව පහත පරිදි වේ.

| | | |
|---|---|---|
| අනුමත සේවක සංඛ්‍යාව | - | 3118 |
| දැනට සිටින සේවක සංඛ්‍යාව | - | 2257 |
| පුරප්පාඩු සංඛ්‍යාව | - | 861 |

පිරිස් හා පාලන යන විෂයන්ට අදාළ සියළුම කටයුතු 2012 වසර තුලදී ආයතන අංශය විසින් සාර්ථකව ක්‍රියාත්මක කරන ලදී.

මෙම කටයුතු, සේවා ව්‍යවස්ථා, බඳවා ගැනීමේ පටිපාටි, ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි සහ අනෙකුත් අදාළ චක්‍රලේඛ යනාදී සියළුම රාජ්‍ය/ රජයේ සහ අනෙකුත් අදාළ නීති, නියමයන් සහ නියෝගයන්ගේ සීමාවන් ඇතුලත සිටිමින් මෙම අංශය විසින් ක්‍රියාත්මක කරන ලදී.

2012 වසර තුලදී පිරිස් හා පාලන අංශය විසින් බඳවා ගැනීම්, උසස් කිරීම්, ස්ථාන මාරු , වැටුප් පරිවර්තන, ණය සහ විනය ආදී කටයුතු සම්බන්ධයෙන් පහත සදහන් ක්‍රියාකාරකම් සිදු කරන ලදී.

### 7.2. බඳවා ගැනීම්

- දෙමළ මාධ්‍ය අඩවි වන නිලධාරීන් 12 කට සහ රියදුරන් 18 කට පත්වීම් ලිපි ලබා දෙනලදී.
- අඩවි වන නිලධාරීන් දෙදෙනෙකු සහ එක් රියදුරකු සේවය සදහා වාර්තා කර නැත.
- නව අභ්‍යාසලාභි උපාධිධාරීන් 40 ක් පුහුණුව සදහා මෙම දෙපාර්තමේන්තුවට දැනටමත් අනුයුක්ත කර තිබේ.
- එවැනි උපාධිධාරීන් 60 ක් බදවා ගැනීමට අනුමැතිය ලැබී තිබේ.

### 7.3. උසස් කිරීම්

- තරග විභාගයේ ප්‍රතිඵල පදනම් කර ගෙන ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ පළමුවන පන්තියේ නිලධාරීන් 10ක් විශේෂ වන පාලක තනතුරට උසස් කරන ලදී.
- අඩවි වන නිලධාරීන් 49 ක් වන පාලක තනතුරට උසස් කරන ලදි. දෙවන පන්තියේ අඩවි වන නිලධාරීන් 10 ක් පළමු වන පන්තියට උසස් කරන ලදි.
- විශේෂ වන පාලකවරු, සහකාර වන සංරක්ෂක තනතුරට උසස් කිරීම සදහා විභාග දෙපාර්තමේන්තුව හරහා විභාග පැවැත්වීමට කටයුතු සම්පාදනය කරන ලදි.
- කනිෂ්ඨ සේවකයින් ශ්‍රේණිගත කිරීම සදහා ඉල්ලුම්පත් කැදවා තිබේ.

- නියෝජ්‍ය වන සංරක්ෂකවරු දෙදෙනෙක් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය වන සංරක්ෂක තනතුරුවලට උසස් කර තිබේ. තවද, සහකාර වන සංරක්ෂකවරු දෙදෙනෙක් වන විද්‍යාලයේ අධ්‍යක්ෂ ලෙස හා නියෝජ්‍ය වන සංරක්ෂක (කලාප) ලෙස පත්කර තිබේ.

## 7.4. විශ්‍රාම ගැනීම්

- එක් පරිපාලන නිලධාරියකු
- විශේෂ වන පාලකවරු පස් දෙනෙක්
- වන පාලකවරු දෙදෙනෙක්
- අඩවි වන නිලධාරීන් තිදෙනෙකු
- රාජ්‍ය කලමණාකාර සහකාරවරු පස් දෙනෙක්
- බීට්ටු වන නිලධාරීන් දහඅට දෙනෙකු
- වගා කම්කරුවන් දෙදෙනෙකු
- වන ක්ෂේත්‍ර සහකාරවරු දෙදෙනෙකු
